## (ඇ) මූල්‍ය හා බැංකු කටයුතු හැඩ ගැස්ම

1965 දී මූල්‍ය ප්‍රාසාරණය ඉකුත් දෙවසරේදීට වඩා අඩු විය. පෞද්ගලික අංශයට[1] දෙන ලද (දළ) බැංකු ණය පරිමාව, 1965 දී වැඩි වූයේ රුපියල් කෝටි 0.42 කින් පමණකි. 1964 [2] දී මෙය රුපියල් කෝටි 6.28 කින් ද, 1963 දී රුපියල් කෝටි 13.69කින් ද වැඩි විය. රජයට දෙන ලද වෙළෙඳ බැංකු ණය රුපියල් කෝටි 9.23කින් වැඩි වූ අතර, රජයට දෙන ලද මහ බැංකු ණය රුපියල් කෝටි 1.07කින් අඩු විය. මෙය 1964 දී ඇති වූවාට වඩා ප්‍රතිවිරුද්ධ හැඩ ගැස්මෙකි. 1964 දී රජයට දෙන ලද වෙළෙඳ බැංකු ණය රුපියල් කෝටි 0.36කින් පමණක් වැඩි වූ අතර, රජයට දෙන ලද මහ බැංකු ණය රුපියල් කෝටි 13.0 කින් වැඩි වී තිබිනි. 1965 දී බැංකු ක්‍රමයෙන් රජයට දෙන ලද මුළු ණය පරිමාව රුපියල් කෝටි 8.16කින් වැඩි විය. මෙය 1964 වර්ෂයේ දී ඇතිවූ වැඩිවීම වන රුපියල් කෝටි 13.36 ට වඩා සැහෙන ප්‍රමාණයකින් අඩු විය. මහ බැංකුවට පවරා දෙන ලද, රජය සතු වූ විදේශීය වත්කම් ද ඇතුළුව බැංකු ක්‍රමය සතු ශුද්ධ විදේශීය වත්කම්, රුපියල් කෝටි 7.97 කින් වැඩිවිය. එහෙත්, එවැනි පැවරුම් රහිතව, එකී වැඩිවීම, 1956 න් පසු ප්‍රථමවරට, රුපියල් කෝටි 4.96 ක් වූයේ ය.

1965 මූල්‍ය ප්‍රාසාරණය ඇතිවූ පිළිවෙළ, 1963 හා 1964 මූල්‍ය ප්‍රාසාරණය ඇතිවූ පිළිවෙලට වඩා කැපී පෙනෙන වෙනස්වීම් තුනකින් යුතුය. ඉකුත් දෙවසරේදී මූල්‍ය ප්‍රාසාරණය ඇතිවූයේ බැංකු ක්‍රමය සතු විදේශීය වත්කම් සැහෙන ප්‍රමාණයකින් පහළ වැටී තිබියදීය. 1965 මූල්‍ය ප්‍රාසාරණය කෙරෙහි බැංකු ක්‍රමය වෙතැති ශුද්ධ විදේශීය විනිමය වැඩිවීම එක්තරා ප්‍රමාණයකට හේතු වූයේය. දෙවනුව, 1963 සහ 1964 මූල්‍ය ප්‍රාසාරණය කෙරෙහි පෞද්ගලික අංශයට දෙන ලද වෙළෙඳ බැංකු ණය ප්‍රසාරණය වීම සැහෙන හේතුවක් වූ නමුදු, 1965 මූල්‍ය ප්‍රාසාරණය කෙරෙහි මෙම සාධකයෙහි බලපෑම ඉතා සුළුවිය. තෙවැනිව, 1963 දී හා 1964 දී ප්‍රධාන ප්‍රාසාරණාත්මක සාධකයක් වූ, රජයට දෙන ලද මහ බැංකු ණය, 1965 දී සංකෝචනාත්මක සාධකයක් වූයේය. මුළු වශයෙන් ගත් කල, 1965 දී ඇතිවූ සුළු මූල්‍ය ප්‍රාසාරණය කෙරෙහි හේතු වූයේ බැංකු විදේශීය වත්කම් වැඩිවීම, පෞද්ගලික අංශයට දෙන ලද වෙළෙඳ බැංකු ණය වැඩිවීම හා රාජ්‍යාංශයට දෙන ලද වෙළෙඳ බැංකු ණය වැඩිවීමය. එසේම රජයට දෙන ලද මහ බැංකු ණය පහළ වැටීමෙන් ද එය තරමක් දුරට සමහන් විය.[3]

**බැංකු නොවන පෞද්ගලික අංශය සතු ද්‍රවශීලතා.**

1965 දෙසැම්බර් අවසානයේදී බැංකු නොවන පෞද්ගලික අංශය සතු මුළු ද්‍රවශීල වත්කම් පරිමාව රුපියල් කෝටි 346.65 ක් වූයේ, රුපියල් කෝටි 24·32 ක හෙවත් සියයට 7.5 ක වැඩිවීමෙක් පිළිබිඹු විය. 1964 දී අනුරූප වැඩිවීම රුපියල්

1· මහ ආණ්ඩුව, වෙළෙඳ බැංකු සහ මහ බැංකුව හැර රජයේ සමායතන, ප්‍රාදේශීය බල මණ්ඩල, සමුපකාර ආයතන සහ විවිධ අර්ධ රාජ්‍ය සංස්ථා හෝ රාජ්‍ය අනුග්‍රහය ලබන සංස්ථා හා නියෝජ්‍යත්වයන් ඇතුළු අන් සියළුම ආයතනයන් පෞද්ගලික අංශයට ඇතුලත් වනසේ අර්ථ නිරූපනය කර ඇත.

2· පෞද්ගලික අංශයට දෙන ලද බැංකු ණය (ආනයන බිල් ඇතුළුව) වැඩිවීම රුපියල් කෝටි 9·20 ක් වූයේ යැයි 1964 වර්ෂය සඳහා වූ වාර්ෂික වාර්තාවේ දක්විනි. එහෙත් මෙම සංඛ්‍යාව, 1964 දෙසැම්බර් අවසාන වන විට මිලට ගෙන තිබූ රජයේ ආනයන බිල් පිළිබඳ සංඛ්‍යාව පෞද්ගලික අංශයට දෙන ලද ණය යටතේ වැරදි ලෙස වාර්තා කර තිබීම නිසා, දැන් සංශෝධනය කර ඇත.

3· මහ බැංකුව, 1965 මැයි 28 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි මහ බැංකු පොළී අනුපාතිකය සියයට 4 සිට සියයට 5 දක්වා වැඩි කළේය. මහ බැංකු පොළී අනුපාතිකය ඉහළ යාමත් සමගම සියළුම වෙළෙඳ බැංකුවල ණයදීමේ පොළී අනුපාතිකය ද ඊට අනුකූලව වැඩි කරනු ලැබිණි. මුළු බැංකු ණය වැඩිවීමේ වේගය මූර්ත ජාතික නිෂ්පාදිතය වැඩිවීමේ වේගයට ගැලපෙන තරම් සීමා කරනු වස් මහ බැංකුව විසින් ද ජූනි 15 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි, ණය සලාක කිරීමේ ක්‍රමයක් ඇති කරනු ලැබින

කෝටි 27.39 ක් හෙවත් සියයට 9·3 ක් විය. 1964 දී රුපියල් කෝටි 11·58 කින් වැඩිවූ ප්‍රාථමික ද්‍රවශීල වත්කම් 1965 දී රුපියල් කෝටි 9·38 කින් වැඩිවිය. ඉකුත් වර්ෂයේදී රුපියල් කෝටි 15·81 කින් වැඩිවූ ද්විතීයක ද්‍රවශීල වත්කම් 1965 දී රුපියල් කෝටි 14·93 කින් වැඩි විය. 'මේ අනුව, 1964 දී සියයට 50·3 ක්වූ, මුළු ද්‍රවශීල වත්කම් කෙරෙහි වූ ප්‍රාථමික ද්‍රවශීල වත්කම් අනුපාතය 1965 දී සියයට 49·5 දක්වා සුළු වශයෙන් පහළ වැටුනේය.

පහත, II (ඇ) I සංඛ්‍යා සටහනෙහි දැක්වෙන පරිදි, 1965 අවසානයේදී මහජනයා වෙතැති ව්‍යවහාර මුදල් ප්‍රමාණය රුපියල් කෝටි 90·14 ක් විය. මෙයින් රුපියල් කෝටි 4·84 ක හෙවත් සියයට 5·7 ක වැඩිවීමක් පිළිබිඹු විය. 1964 දී එහි වැඩිවීම, රුපියල් කෝටි 2·46 ක් හෙවත් සියයට 3·0 ක් විය. අනෙක් අතට, මහජනයා වෙතැති ඉල්ලුම් තැන්පතු රුපියල් කෝටි 4·55 කින් රුපියල් කෝටි 81·43 දක්වා හෙවත් සියයට 5·9 කින් වැඩි විය. මෙය, 1964 අනුරූප වැඩිවීම වන රුපියල් කෝටි 9·11 හෙවත් සියයට 13·4 ට වඩා සැලකිය යුතු ලෙස අඩු විය. එසේ වූවද, මුදල් සැපයුම කෙරෙහි ඉල්ලුම් තැන්පතු අනුපාතය නොවෙනස්වම වාගේ පැවැති බැව් මුදල් සැපයුම පිළිබඳව පහත එන I (අ) කොටසේ II (ඇ) 3 සංඛ්‍යා සටහනින් පෙනී යයි. 1964 දී සියයට 47.4 ක්වූ එම අනුපාතය 1965 දී සියයට 47·5 ක් වූයේය. 1965 දෙසැම්බර් අවසානයේදී ලංකා ඉතිරි කිරීමේ බැංකුව හා තැපැල් කන්තෝරු ඉතිරි කිරීමේ බැංකුව වෙතැති තැන්පතු හා වෙළෙඳ බැංකු වෙතැති කාලීන හා ඉතිරි කිරීම් තැන්පතු රුපියල් කෝටි 106·99 දක්වා රුපියල් කෝටි 6·55 කින් (සියයට 6·5 කින්) වැඩිවිය. 1964 දී මෙම ආයතනවල තැන්පතු පරිමාවෙහි වැඩිවීම රුපියල් කෝටි 8·37 ක් හෙවත් සියයට 9·1 ක් වූයේය. මහජනයා වෙතැති ඉතිරි කිරීමේ සහතික හා භාණ්ඩාගාර බිල් පිළිවෙළින් රුපියල් කෝටි 0·44 කින් හා රුපියල් කෝටි 0·43 කින් වැඩිවිය. බැංකු නොවන පෞද්ගලික අංශය වෙතැති ද්විතීයක ද්‍රවශීල වත්කම් අතුරින් විශාල තම තනි වර්ගය වූ රජයේ පිළිනපත්වල එකතුව රුපියල් කෝටි 58·67 ක් වූයේ, රුපියල් කෝටි 8·10 කින් හෙවත් සියයට 16.0ක වැඩිවීමෙක් සටහන් විය. 1964දී එහි වැඩිවීම රුපියල් කෝටි 5.91 ක් හෙවත්, සියයට 13.2ක් විය. 1965 දී පෞද්ගලික අංශය වෙතවූ මුළු ද්‍රවශීල වත්කම් වැඩිවීමෙන් සියයට 33·3 ක් සඳහා හේතු වූයේ රජයේ පිළිනපත්ය. මෙම වැඩිවීමෙන් රුපියල් කෝටි 4·2 ක් රක්ෂණ සංස්ථාව විසින් ලබාගෙන ඇති අතර ඉතිරියෙන් විශාල කොටසක් භාරකාර මණ්ඩල, සුබසාධක, විශ්‍රාම වැටුප් හා අර්ථසාධක අරමුදල් (සේවක අර්ථ සාධක අරමුදල හැර) විසින් ලබාගෙන තිබිණි. වර්ෂය තුළ බැංකු නොවන පෞද්ගලික අංශය වෙතවූ බදු සංචිත සහතික රුපියල් කෝටි 0·54 කින් හෙවත් සියයට 13·0 කින් සංකෝචනය විය.

ඉහත සඳහන් විග්‍රහයෙන් දැක්වෙන පරිදි, 1965 දී මහජනයා වෙතැති ඉල්ලුම් තැන්පතු විශාල වශයෙන් වැඩි නොවූ බවත්, ප්‍රාථමික හා ද්විතීයක ද්‍රවශීල වත් කම් දෙවර්ගයෙන් එක් වර්ගයක් සඳහා මහජනයා විශේෂ සැලකිල්ලක් දක්වා නොමැති බවත් පෙනීයයි. 1964 සමග සසඳන කල, ද්විතීයක ද්‍රවශීල වත්කම්වල විවිධ මාර්ග කෙරෙහි මහජන රුචියෙහිදු කැපී පෙනෙන වෙනසෙක් ද්විතීයක ද්‍රවශීලතා වර්ධනයෙන් පිළිබිඹු නොවීය.

## සංඛ්‍යා සටහන II (ඇ) 1

## බැංකු නොවන පෞද්ගලික අංශයේ මුළු ද්‍රවශීල වත්කම්

## 1963 - 1965

| විස්තර | ප්‍රමාණය (රුපියල් දශ ලක්ෂ) | | | දළ ජාතික නිෂ්පාදිතයෙහි ප්‍රතිශතයක් වශයෙන් (අ) | | |
|---|---|---|---|---|---|---|
| | 1963 | 1964 | 1965 | 1963 | 1964 | 1965 |
| 1. මූලික ද්‍රවශීල වත්කම් | | | | | | |
| (අ) නෝට්ටු හා කාසි .. .. | 828.4 | 853.0 | 901.4 | 12.3 | 12.0 | 12.2 |
| (ආ) ඉල්ලුම් තැන්පතු .. .. | 677.7 | 768.8 | 814.3 | 10.1 | 10.8 | 11.0 |
| එකතුව .. .. .. | 1506.0 | 1621.8 | 1715 7 | 22.4 | 22.8 | 23.2 |
| වෙනසෙහි සියයට ගණන .. | | + 7.7 | + 5.8 | | | |
| 2. ද්විතීයික ද්‍රවශීල වත්කම් | | | | | | |
| (අ) වෙළෙඳ බැංකු වෙතැති ඉතිරි කිරීම තැන්පතු .. .. .. | 165.2 | 193.5 | 223.9 | 2.5 | 2.7 | 3.0 |
| (ආ) තැපැල් කන්තෝරු ඉතිරි කිරීමේ බැංකුව වෙතැති ඉතිරිකිරීම් තැන්පතු | 375.5 | 402.3 | 418.3* | 5.6 | 5.6 | 5.7 |
| (ඇ) ලංකා ඉතිරි කිරීමේ බැංකුව වෙතැති ඉතිරිකිරීම් තැන්පතු .. .. | 77.2 | 81.6 | 84.2* | 1.1 | 1.1 | 1.1 |
| (ඈ) වෙළෙඳ බැංකු වෙතැති කාලීන තැන්පතු .. .. .. | 302.8 | 327.0 | 343.5 | 4.5 | 4.6 | 4.6 |
| (ඉ) මෙරට පදිංචිකරුවන් සතු විදේශීය ශේෂ .. .. .. | 15.9 | 12.0 | 11.5* | 0.2 | 0.2 | 0.2 |
| (ඊ) ඉතිරි කිරීමේ සහතික .. .. | 34.4 | 37.4 | 41.8 | 0.5 | 0.5 | 0.6 |
| (උ) භාණ්ඩාගාර බිල්පත් .. .. | 0.5 | 0.5 | 4.8 | ... | ... | 0.1 |
| (ඌ) බදු සංචිත සහතික .. .. | 25.3 | 41.5 | 36.1 | 0.4 | 0.6 | 0.5 |
| (එ) රජයේ පිළිනපත් .. .. | 416.6 | 505.7 | 586.7 | 6.6 | 7.1 | 7.9 |
| එකතුව .. .. .. | 1443.4 | 1601.5 | 1750.8* | 21.5 | 22.5 | 23.7 |
| වෙනසෙහි සියයට ගණන .. .. | | + 10.9 | + 9.3 | | | |
| 3. පෞද්ගලික අංශයේ මුළු ද්‍රවශීල වත්කම් | 2949.4 | 3223.3 | 3466.5* | 43.9 | 45.3 | 46.9 |
| වෙනසෙහි සියයට ගණන .. .. | | + 9.3 | + 7.5 | | | |
| ඉහත සංඛ්‍යා වලට තැපැල් කන්තෝරු ඉතිරි කිරීමේ බැංකුව, ලංකා ඉතිරි කිරීමේ බැංකුව, සේවක අර්ථසාධක අරමුදල ආදී රජයේ මූල්‍ය ආයතන වෙතැති භාණ්ඩාගාර බිල් හා රජයේ පිළිනපත් ඇතුලත් කොට නොමැත .. .. .. | 886.6 | 1022.9 | 1229.9 | 13.2 | 14.4 | 16.6 |

සංඛ්‍යා: ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

(අ) පවත්නා සාධක මිල අනුව
* තාවකාලිකයි.

## සංඛ්‍යා සටහන II (ඇ) 2

## වෙළෙඳ බැංකු වෙතැති, පෞද්ගලික අංශය සතු මුළු තැන්පතු පරිමාවෙහි වෙනස්වීම් - හිමිකරු ගණයන් අනුව

රුපියල් දශ ලක්ෂ

| | 1964 | 1965 | එකතුව |
|---|---|---|---|
| 1. බැංකු නොවන මූල්‍ය සංස්ථා | + 3.9 | + 1.2 | + 5.1 |
| 2. වැවිලි | − 15.7 | + 12.9 | − 2.8 |
| 3. වෙළෙඳ ආයතන | + 19.3 | + 8.7 | + 28.0 |
| 4. අනෙකුත් ව්‍යාපාර | + 11.2 | + 20.7 | + 31.9 |
| 5. ප්‍රාදේශීය බලමණ්ඩල | + 6.5 | − 11.5 | − 5.0 |
| 6. ව්‍යාපාරික නොවන ආයතන | + 13.8 | − 24.3 | − 10.5 |
| 7. පුද්ගලයින් | + 81.4 | + 60.6 | + 142.0 |
| එකතුව | + 120.4 | + 68.3 | + 188.7 |

සංඛ්‍යා: ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

මහ බැංකුව විසින් රැස් කරන ලද සමීක්ෂණ සංඛ්‍යා තොරතුරු පදනම් කර ගෙන හිමිකාර ගණයන් අනුව වූ පෞද්ගලික අංශයේ තැන්පතු පිළිබඳ සංඛ්‍යා ඉහත II (ඇ) – 2 සංඛ්‍යා සටහනෙහි දැක්වෙයි. පෙරාතුව වූ වර්ෂයේදී මෙන්ම 1965 දීද තැන්පතුවල විශාලතම වැඩිවීම ඇතිවූයේ "පුද්ගලයන්" සතු තැන්පතු වලය. එය රුපියල් කෝටි 6·06 ක් විය. 1964 දී රුපියල් කෝටි 1·57 කින් සංකෝචනය වූ වැවිලිවල තැන්පතු මෙම වර්ෂයේදී රුපියල් කෝටි 1·29 කින් වැඩිවිය මේ මෙසේ වැඩිවීමට 1964 ජූලි මාසයේ පනවන ලද ලාභාංශ ප්‍රේෂණය කල් තැබීමේ නීත්‍යානුකූල බලය හේතුවූවා විය හැකිය. 1965 අගෝස්තු මාසයේදී තරමක් ලිහිල් කළ ද, 1965 වර්ෂය මුළුල්ලේම ඒ බලපැවැත්විණි. 1964 දී රුපියල් කෝටි 1·93 කින් වැඩි වූ වෙළෙඳ ආයතනවල තැන්පතු 1965 දී රුපියල් කෝටි 0·87කින් තරමක් දුරට වැඩිවිය. රුපියල් කෝටි 2·07 ක්වූ "අනෙකුත් ව්‍යාපාර" ගණයේ තැන්පතු වැඩිවීම ඉකුත් වර්ෂයේදීට වඩා වැඩිවිය. එසේ වුවද, ප්‍රාදේශීය බල මණ්ඩලවල හා ව්‍යාපාරික නොවන ආයතනවල තැන්පතු සැහෙන පමණකින් සංකෝචනය විය.

### I. (අ) මුදල් සැපැයුම

1965 දෙසැම්බර් අවසානය වන විට මුදල් සැපැයුම රුපියල් කෝටි 171·57 ක් විය. මෙයින් රුපියල් කෝටි 9·38 ක හෙවත් සියයට 5·8 ක වැඩිවීමෙක් පිළිබිඹු වෙයි. 1964 දී අනුරූප වැඩිවීම රුපියල් කෝටි 11·58ක් හෙවත් සියයට 7·7 ක්වූ අතර 1963දී එය රුපියල් කෝටි 16.33 ක් හෙවත්, සියයට 12.2 ක් වූයේය. 1964 හා 1963 සමග සසඳන කල, 1965 දී මුදල් සැපැයුමෙහි සුළු වැඩිවීම, බැංකු නොවන පෞද්ගලික අංශයේ මුළු ද්‍රවශීල වත්කම් හි වැඩිවීම කෙරෙහි වූ මුදල් සැපැයුමේ අනුපාතය වැඩිවීමෙන් පිළිබිඹු විය. 1963 දී සියයට 55 ක්ද, 1964 දී සියයට 42 ක්ද වූ එම අනුපාතය 1965 දී සියයට 38·5 ක් විය. 1965 අනුපාතය, මුදල් සැපැයුම සියයට 4·2 කින් වැඩිවූ 1962 වර්ෂයේදී සියයට 37 ක්වූ අනුපාතයත් සමග සැසඳිය හැකිය. 1963 හා 1964 සමග සසඳන කල එය තරමක වැඩිවීමෙකි.

සංඛ්‍යා සටහන II (ඇ) 3

මුදල් සැපැයුමෙහි සැකැසුම

රුපියල් දශ ලක්ෂ

| කාලච්ඡේදය අවසානයේදී | මහජනයා වෙතැති ව්‍යවහාර මුදල් | | මහජනයා සතු ඉල්ලුම් තැන්පතු | | මුළු මුදල් සැපැයුම |
|---|---|---|---|---|---|
| | ප්‍රමාණය | මුළු මුදල් සැපයුමෙහි ප්‍රතිශතයක් වශයෙන් | ප්‍රමාණය | මුළු මුදල් සැපයුමෙහි ප්‍රතිශතයක් වශයෙන් | |
| 1953 | 335·3 | 40·6 | 491·5 | 59·4 | 826·8 |
| 1954 | 341·8 | 35·7 | 615·3 | 64·3 | 957·1 |
| 1955 | 384·5 | 35·8 | 688·4 | 64·2 | 1072·9 |
| 1956 | 401·1 | 35·6 | 725·7 | 64·4 | 1126·8 |
| 1957 | 434·9 | 41·8 | 605·2 | 58·2 | 1040·1 |
| 1958 | 529·8 | 49·2 | 546·9 | 50·8 | 1076·8 |
| 1959 | 565·0 | 48·0 | 612·7 | 52·0 | 1177·7 |
| 1960 | 595·3 | 49·2 | 613·6 | 50·8 | 1208·9 |
| 1961 | 692·2 | 53·8 | 596·4 | 46·2 | 1288·6 |
| 1962 | 712·6 | 53·1 | 630·0 | 46·9 | 1342·7 |
| 1963 | 828·4 | 55·0 | 677·7 | 45·0 | 1506·0 |
| 1964 | 853·0 | 52·6 | 768·8 | 47·4 | 1621·8 |
| 1965 | 901·4 | 52·5 | 814·3 | 47·5 | 1715·7 |

සංඛ්‍යා: ශ්‍රී ලංකා මහ බැංකුවෙනි

මුදල් සැපැයුමෙන් වැඩි සමානුපාතිකයක් ඉල්ලුම් තැන්පතු වශයෙන් තබා ගැනීමට වඩා ව්‍යවහාර මුදල් වශයෙන් තබා ගැනීමට පැවැති මහජන රුචියේ, ප්‍රතිවර්තනය කෙරෙහි 1964 වර්ෂයේ වාර්ෂික වාර්තාවෙන් අවධානය යොමු කරන ලදී. 1964 ජූනි හා දෙසැම්බර් අතරතුරේදී මහජනයා වෙතැවූ ව්‍යවහාර මුදල් වල සැකැස්මෙහි වූ වැදගත් වෙනස්වීම් කෙරෙහි ද අවධානය යොමු කර වනු ලැබින. 1965 දී මුළු මුදල් සැපැයුම කෙරෙහි වූ ව්‍යවහාර මුදල් අනුපාතය 1964 ට වඩා නො නොවෙනස්ව ම වාගේ සියයට 52·5 හි පැවැති බැව් පහත II (ඇ) 3 සංඛ්‍යා සටහනින් දැක්වෙයි. එහෙත්, මහජනයා වෙතැවූ ව්‍යවහාර මුදල් සැකැසුනු අයුරු 1965 වර්ෂය තුළ දී කැපී පෙනෙන ලෙස

වෙනස් විය. 1964 මැයි අවසානයේ සිට දෙසැම්බර් අවසානය දක්වා කාලච්ඡේදය තුළ දී රුපියල් 100යේ නෝට්ටු රුපියල් කෝටි 13·0කින් තියුණු ලෙස පහළ වැටුණු අතර, රුපියල් 50හේ හා රුපියල් 10යේ නෝට්ටු වර්ග පිළිවෙළින් රුපියල් කෝටි 1·2 කින් හා රුපියල් කෝටි 10·2කින් වැඩි වූ බැව් පහත II (ඇ) 4 සංඛ්‍යා සටහනින් පෙනී යනු ඇත. අනෙක් අතට, 1965 දී මහ බැංකුවේ මුළු ව්‍යවහාර මුදල් වගකීම් රුපියල් කෝටි 7·07කින් වැඩි වූ අතර, රුපියල් 5හේ සහ 10යේ නෝට්ටු වර්ග සංසරණය රුපියල් කෝටි 4·48කින් සංකෝචනය වූ නමුදු රුපියල් 100යේ හා රුපියල් 50හේ වර්ග වල නෝට්ටු පිළිවෙළින් රුපියල් කෝටි 7·15 කින් හා රුපියල් කෝටි 3·95 කින් වැඩි විය. 1964 දී දක්නට ලැබුන ඉහළ වර්ග වල නෝට්ටු වලින් පහළ වර්ග වල නෝට්ටු වලට මාරු වීම 1965 දී බොහෝදුරට ප්‍රතිවර්තිත වූබැව් පෙනී යයි.

**සංඛ්‍යා සටහන II (ඇ) 4**

**ව්‍යවහාර මුදල් සංයුතිය -- රු. 100, 50. 10 සහ 5 හේ**

**වටිනාකම් අනුව**

රුපියල් දශ ලක්ෂ

| කාලච්ඡෙදය අවසානයේ දී | රු. 100 | රු. 50 | රු. 10 | රු. 5 | ව්‍යවහාර මුදල් නිකුතුව * |
|---|---|---|---|---|---|
| 1960 දෙසැම්බර් .. .. .. | 148·4 | 148·4 | 237·6 | 40·1 | 644·6 |
| 1961 දෙසැම්බර් .. .. .. | 211·9 | 180·3 | 254·6 | 42·1 | 763·8 |
| 1962 දෙසැම්බර් .. .. .. | 238·2 | 186·8 | 241·9 | 42·8 | 789·4 |
| 1963 දෙසැම්බර් .. .. .. | 275·3 | 236·7 | 257·6 | 46·5 | 900·9 |
| 1964 මැයි .. .. .. | 298·0 | 246·5 | 257·4 | 47·8 | 937·6 |
| 1964 දෙසැම්බර් .. .. .. | 168·4 | 258·3 | 359·5 | 55·5 | 932·1 |
| 1965 දෙසැම්බර් .. . . | 239·9 | 297·8 | 319·7 | 50·5 | 1,002·8 |

සංඛ්‍යා: ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

* රුපියල් 2 සහ 1 නෝට්ටු සහ කාසි සියල්ලම ද අඩංගු වෙයි.

මෙය 1964 වාර්ෂික වාර්තාවේ සඳහන් කැරුන පහත සඳහන් ප්‍රකාශය මෙයින් සනාථ වෙන බැව් පෙනී යයි. "අයබදු නොගෙවා මඟහැරීම සහ වැඩි වටිනාකමක් ඇති නෝට්ටු වශයෙන් අප්‍රකාශිත වත්කම් රාශිකරණය කිරීම වැළැක්වීම සඳහා විධිවිධාන පැන වෙතැයි යන බලාපොරොත්තුව නිසා මේ වෙනස ඇති වුනා විය හැකිය." එසේ වුවද, හර බද්දට අසුවීමෙන් වැලකෙනු වස් මුදලෙන් ගෙවීමට පොරොන්දු වූ ගනුදෙනු පහසුකර ගැනීම සඳහා වැඩි වටිනාකම් වල මුදල් නෝට්ටු සැහෙන සමානුපාතයක් තබා ගන්නට ඇති බැවින් ඉහත ප්‍රකාශය නිසැකව ම තහවුරු කළ නොහැකිය. 1957 දී පැන වුන බැංකු හර බද්ද ක්‍රියාත්මක වෙමින් පැවැති කාලච්ඡේදයේ දී මුළු මුදල් සැපැයුම කෙරෙහි වූ ඉල්ලුම් තැන්පතු අනුපාතය වේගවත් ලෙස පහළ වැටී තිබීම මෙහිලා සැලකිය යුතු කරුණෙකි. 1965 ඔක්තෝබර් 1 වැනි දින සිට බැංකු හර බද්ද ඉවත් කරන ලදී. එහෙත් හර බද්ද ඉවත් කිරීමෙන් මුදල් සැපැයුම් සැකැස්මෙහි ඇති වූ බලපෑම පරීක්ෂා කිරීම සඳහා කල්පිරුනේ නොවේ.

1960/65 කාලච්ඡේදය තුළ දී මුදල් සැපැයුම කෙරෙහි බලපෑ සාධක, අංශ අනුව වර්ග කොට II (ඇ) 5 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත. මෙම අංශ අනුව වූ වර්ගකරණයෙන් බැංකු ක්‍රමය සමග වූ රාජ්‍ය අංශයේ හා පෞද්ගලික අංශයේ ගනුදෙනු වලින් උත්පාදනය වන වෙනස්වීම් මෙන්ම බැංකු ක්‍රමය වෙතැති ශුඩ විදේශීය වත්කම් වෙනස්වීමෙන් උත්පාදනය වන වෙනස්වීම ද හඳුනාගත හැකිය. 1965 මුදල් සැපැයුමෙහි ඒ ඒ අංශ වලින් උත්පාදනය වූ වෙනස්වීම් හි වැදගත් වෙනස්කම් දක්නට ලැබිණි. 1965 තෙක් වූ පස් අවුරුදු කාලයේ දී මූල්‍ය ප්‍රාසාරණය කෙරෙහි ලා බල පැවැත් වූ ප්‍රධාන හේතුව වූයේ බැංකු ක්‍රමය වෙතින් රජයේ ණය ගැනීම් නොකඩවා වැඩිවීමය. මේ ණය වලින් විශාල කොටසක් මහ බැංකුවෙන් ද, ඊට අඩු කොටසක් වෙළෙඳ බැංකු වලින් ද ලබා ගන්නා ලදී. 1963 දී හා 1964 දී පෞද්ගලික අංශයට දෙන ලද බැංකු ණය විශාල වශයෙන් වැඩිවීම මූල්‍ය ප්‍රාසාරණයට රුකුලක් විය. 1961 දී හැර, සෙසු වර්ෂ වල දී, බැංකු වෙතැති කාලීන හා ඉතිරි කිරීම් තැන්පතු නොකඩවාම වැඩි කිරීමෙන් ද, බැංකු ක්‍රමය වෙතැති විදේශීය වත්කම් අඩු කිරීමෙන්ද, මෙම මූල්‍ය ප්‍රාසාරණය තරමක් සීමා කරනු ලැබීය.

## සංඛ්‍යා සටහන II (ඇ) 5
## මුදල් සැපයුමේ වෙනස්වීම්

රුපියල් දශ ලක්ෂ

| මුදල් සැපයුම කෙරෙහි බලපෑ සාධක | 1959 සහ 1960 අතර | | 1960 සහ 1961 අතර | | 1961 සහ 1962 අතර | | 1962 සහ 1963 අතර | | 1963 සහ 1964 අතර | | 1964 සහ 1965 අතර | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රසාරණාත්මක සාධක | සංකෝචනාත්මක සාධක | ප්‍රසාරණාත්මක සාධක | සංකෝචනාත්මක සාධක | ප්‍රසාරණාත්මක සාධක | සංකෝචනාත්මක සාධක | ප්‍රසාරණාත්මක සාධක | සංකෝචනාත්මක සාධක | ප්‍රසාරණාත්මක සාධක | සංකෝචනාත්මක සාධක | ප්‍රසාරණාත්මක සාධක | සංකෝචනාත්මක සාධක |
| 1. බැංකු සතු විදේශීය වත්කම් (ශුද්ධ) .. | – | 170·2 | – | 78·6 | – | 91·1 | – | 53·2 | 16·9* | – | 79·7** | – |
| 2. පෞද්ගලික අංශය†† | | | | | | | | | | | | |
| (අ) සමුපකාර ආයතනවලට දෙන ලද වෙළෙඳ බැංකු ණය .. | – | – | – | – | – | – | – | – | – | – | – | 6·9 |
| (ආ) පෞද්ගලික අංශයේ අනෙකුත් තැන්පතු කරුවනට දෙන ලද වෙළෙඳ බැංකු ණය‡ .. | 31·5 | – | 12·5 | – | 42·2 | – | 124·2 | – | 82·6 | – | 10·1 | – |
| (ඇ) සමුපකාර ආයතනවලට දෙන ලද කාලීන හා ඉතිරිකිරීම් තැන්පතු .. | – | – | – | – | – | – | – | – | – | – | – | 2·1 |
| (ඈ) පෞද්ගලික අංශයේ අනෙකුත් තැන්පතු කරුවනට දෙන ලද කාලීන හා ඉතිරි කිරීම් තැන්පතු .. | – | 63·8 | 9·2 | – | – | 50·2 | – | 63·4 | – | 52·5 | – | 46·2 |
| (ඉ) වෙළෙඳ බැංකුවල අනෙකුත් වගකීම් හා ගිණුම් (ශුද්ධ) .. | – | 8·7 | – | 28·8 | – | 0·7 | 8·1 | – | – | 4·9 | – | 20·2 |
| රජයේ සමායතන | | | | | | | | | | | | |
| (ඊ) රජයේ සමායතනවලට දෙන ලද වෙළෙඳ බැංකු ණය .. | – | – | – | – | – | – | – | – | – | – | 7·8 | – |
| (උ) වෙළෙඳ බැංකු වෙතැති, රජයේ සමායතනවල කාලීන හා ඉතිරි කිරීම් තැන්පතු .. | – | – | – | – | – | – | – | – | – | – | 1·4 | – |
| 3. රාජ්‍යාංශය | | | | | | | | | | | | |
| (අ) වෙළෙඳ බැංකු වෙතැති භාණ්ඩාගාර බිල්පත්, රජයේ හා රජය ඇපවූ සුරකුම්පත් සහ රජයේ ආනයන බිල්පත් .. | 6·0 | – | 21·4 | – | 71·3 | – | 20·4 | – | 3·6 | – | 92·3 | – |
| (ආ) මහ බැංකුව වෙතැති භාණ්ඩාගාර බිල්පත් සහ රජයේ හා රජය ඇපවූ සුරකුම්පත් .. | 224·3 | – | 140·8 | – | 175·9 | – | 139·5 | – | 123·2 | – | – | 38·7 |
| (ඇ) මහ බැංකුව රජයට දුන් තාවකාලික අත්තිකාරම් .. | 21·9 | – | 1·9 | – | 3·0 | – | 7·0 | – | 6·8 | – | 28·0 | – |
| (ඈ) මහ බැංකුවේ අනෙකුත් වගකීම් හා ගිණුම් (ශුද්ධ) .. | – | 19·3 | – | 9·1 | – | 18·6 | – | 10·7 | – | 54·8† | – | 4·5 |
| (ඉ) බැංකු වෙතැති, රජයේ තැන්පතු හා භාණ්ඩාගාරය හා කච්චේරි වෙතැති මුදල් ශේෂ .. | 8·0 | – | 9·4 | – | – | 76·1 | – | 8·3 | – | 2·9 | – | 10·0 |
| 4. භූවමාරුවෙහි පවත්නා ශීර්ෂයන් සඳහා ගැලපිළි .. | 1·4 | – | 1·0 | – | – | 1·7 | – | 0·2 | – | 2·3 | 3·2 | – |
| මුළු ප්‍රාසාරණාත්මක/සංකෝචනාත්මක සාධක .. | 293·1 | 262·0 | 196·2 | 116·5 | 292·4 | 238·4 | 299·2 | 135·8 | 233·1 | 117·4 | 222·5 | 128·6 |
| මුදල් සැපයුමෙහි වෙනස .. | +31·1 | | +79·8 | | +54·0 | | +163·3 | | +115·8 | | +93·8 | |

සංඛ්‍යා: ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

* 1964 පෙබරවාරි මාසයේදී, මහ බැංකුව රුපියල් කෝටි 5·33 ක ප්‍රකාශිත වටිනාකමට රජයේ ආයතන වලින් මිලට ගත් විදේශීය වත්කම්ද ඇතුළත්ය. මෙයට ඉඩ හළවිට, ශුද්ධ බැංකු විදේශීය වත්කම් වසර තුළදී ඇත්ත වශයෙන්ම, රුපියල් කෝටි 3·64 කින් පහළ වැටී ඇත

** 1965 මැයි මාසයේදී මහ බැංකුව, රජයේ ආයතන වලින් රුපියල් කෝටි 3·01 ක ප්‍රකාශිත වටිනාකමට මිලට ගත් විදේශීය වත්කම්ද ඇතුළත්ය. මෙයට ඉඩහළ විට, ශුද්ධ බැංකු විදේශීය වත්කම්හි. රුපියල් කෝටි 4·96 ක වැඩිවීමෙක් පිළිබිඹුවෙයි. රජයේ ආයතනවලට රුපියල් වලින් මිල ගෙවීම හේතුකොට ගෙන මුදල් සැපයුම කෙරෙහි එක එල්ලේම ප්‍රාසාරණාත්මක බලපෑමක් ඇති විය.

‡ වට්ටම් කළ අපනයන බිල්පත්වල වටිනාකම බැංකු විදේශීය වත්කම් යටතේ ඇතුළත් කැරිණි.

† රජයේ ආයතනවලට වැඩිවූ මහ බැංකු වගකීම්වලින් රුපියල් කෝටි 5·33 ක්ම රජයේ සමායතනවලට එම වටිනාකමට නිකුත් කරන ලද මහ බැංකු සුරකුම්පත් වෙයි. කෙසේ වුවද. මෙයින් ශුද්ධ මුදල් මැවීමක් සිදුවී නොමැත.

†† සමුපකාර ආයතනවල හා රජයේ සමායතනවල සංඛ්‍යා තොරතුරු වෙන වෙනම ලබාගත හැක්කේ 1964–65 කාලච්ඡේදය සම්බන්ධයෙන් පමණෙකි. ඊට කලින් කාලච්ඡේදයන් සඳහාවූ මෙම සංඛ්‍යා තොරතුරු "පෞද්ගලික අංශයේ අනෙකුත් තැන්පතු කරුවන්" යටතේ ඇතුළත් කැරිණි.

## සංඛ්‍යා සටහන II (ඇ) 6

## මුදල් සැපයුම

රුපියල් දශ ලක්ෂ

| කාලච්ඡේදය අවසානයේදී | 1960 | 1961 | 1962 | 1963 | 1964 | 1965 | 1960 සහ 1961 අතරවූ වෙනස % | 1961 සහ 1962 අතර වූ වෙනස % | 1962 සහ 1963 අතර වූ වෙනස % | 1963 සහ 1964 අතර වූ වෙනස % | 1964 සහ 1965 අතර වූ වෙනස % |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ජනවාරි .. .. .. | 1,180 | 1,207 | 1,426 | 1,347 | 1,468 | 1,615 | + 2·3 | +18·1 | — 5·5 | + 9·0 | +10·0 |
| පෙබරවාරි .. .. .. | 1,192 | 1,193 | 1,561 | 1,369 | 1,501 | 1,582 | + 0·1 | +30·8 | —12·3 | + 9·6 | + 5·4 |
| මාර්තු .. .. .. | 1,194 | 1,210 | 1,635 | 1,385 | 1,505 | 1,585 | + 1·3 | +35·1 | —15·3 | + 8·7 | + 5·3 |
| අප්‍රියෙල් .. .. .. | 1,165 | 1,306 | 1,448 | 1,400 | 1,534 | 1,601 | +12·1 | +10·9 | — 3·3 | + 9·6 | + 4·4 |
| මැයි .. .. .. | 1,163 | 1,219 | 1,317 | 1,431 | 1,547 | 1,645 | + 4·8 | + 8·0 | + 8·6 | + 8·1 | + 6·3 |
| ජුනි .. .. .. | 1,170 | 1,221 | 1,298 | 1,448 | 1,550 | 1,650 | + 4·4 | + 6·3 | +11·5 | + 7·0 | + 6·4 |
| ජුලි .. .. .. | 1,150 | 1,223 | 1,277 | 1,447 | 1,543 | 1,693 | + 6·3 | + 4·4 | +13 3 | + 6·6 | + 9·7 |
| අගෝස්තු .. .. .. | 1,161 | 1,231 | 1,270 | 1,474 | 1,529 | 1,674 | + 6·0 | + 3·2 | +16·1 | + 3·7 | + 9·5 |
| සැප්තැම්බර් .. .. .. | 1,181 | 1,261 | 1,294 | 1,499 | 1,549 | 1,675 | + 6·8 | + 2·6 | +15·8 | + 3·3 | + 8·1 |
| ඔක්තෝබර් .. .. .. | 1,212 | 1,248 | 1,317 | 1,505 | 1,592 | 1,687 | + 3·0 | + 5·5 | +14·3 | + 5·8 | + 6·0 |
| නොවැම්බර් .. .. .. | 1,219 | 1,251 | 1,307 | 1,533 | 1,603 | 1,677 | + 2·6 | + 4·5 | +17·3 | + 4·6 | + 4·6 |
| දෙසැම්බර් .. .. .. | 1,209 | 1,289 | 1,343 | 1,506 | 1,622 | 1,716 | + 6·6 | + 4·2 | +12·2 | + 7·7 | + 5·8 |

සංඛ්‍යා—ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

1965 දී රාජ්‍ය අංශයේ ගනුදෙනු ප්‍රාසාරණය වෙමින් තිබුන ද, ඒ සිදු වූයේ ඉකුත් වර්ෂයේ දී ට වඩා අඩු ප්‍රමාණයකිනි. එසේ වුවද, රජයට දෙන ලද මහ බැංකු ණය පහල වැටීමෙක් සටහන් විය. 1964 දී රුපියල් කෝටි 12·32 කින් වැඩි වූ මහ බැංකුව වෙතැති රජයේ හා රජය ඇප වූ සුරැකුම්පත් 1965 දී රුපියල් කෝටි 3·87 කින් සංකෝචනය විය. එහෙත් රජයට දෙන ලද මහ බැංකු තාවකාලික අත්තිකාරම් රුපියල් කෝටි 2·8 කින් වැඩිවීමෙන්, 1965 දී රජයට දෙන ලද මුළු මහ බැංකු ණය පරිමාවේ පහල වැටීම රුපියල් කෝටි 1·07 කට සීමා විය. අනෙක් අතට, 1964 දී රුපියල් කෝටි 0·36 කින් වැඩි වූ රජයට ලබා දෙන ලද වෙළෙඳ බැංකු ණය 1965 දී රුපියල් කෝටි 9·23 කින් වැඩි විය. 1965 දී ඇති වූ විශාල වැඩිවීමට ප්‍රධාන වශයෙන් ම හේතු වූයේ රජයේ ආනයන බිල්පත් රුපියල් කෝටි 5·95 දක්වා වැඩිවීමය. 1964 දී මෙය වැඩි වූයේ රුපියල් කෝටි 0·33 කින් පමණකි. 1964 දී රුපියල් කෝටි 8·26 කින් වැඩි වූ පෞද්ගලික අංශයට දෙන ලද වෙළෙඳ බැංකු ණය (අපනයන බිල් හැර) 1965 දී වැඩි වූයේ රුපියල් කෝටි 1·10 කින් පමණෙකි. 1965 දී, ඉකුත් වර්ෂයේ දී මෙන් ම කාලීන හා ඉතිරි කිරීම් තැන්පතු සැහෙන ප්‍රමාණයකින් වැඩි වූ නමුදු, 1956 න් පසු ප්‍රථම වරට බැංකු විදේශීය වත්කම් වලින් රුපියල් කෝටි 7·97 ක ප්‍රාසාරණාත්මක බලපෑමක් ඇති විය. එසේ වුවද, මෙම සංඛ්‍යාවට, මහ බැංකුව විසින් රජයේ ආයතන වලින් අත්පත් කර ගත්තා ලද විදේශීය සුරැකුම්පත් වල ගැනුම් මිල වූ රුපියල් කෝටි 3·01 ක් ද ඇතුලත් විය. මෙම වර්ෂයේ මුළු මූල්‍ය ප්‍රාසාරණය රුපියල් කෝටි 9·38 ක් වූයේ 1962 න් පසු සටහන් වූ අඩු ම සංඛ්‍යාව විය. 1965 දී මූල්‍ය ප්‍රාසාරණයෙහිලා තුඩුදුන් මූලික හැඩ ගැස්ම වූයේ පෞද්ගලික අංශයට දෙන ලද වෙළෙඳ බැංකු ණය සාපේක්ෂක ලෙස මඳ වශයෙන් වැඩි වීමය.

1965 මුල් කාර්තුවේ දී මුදල් සැපැයුම රුපියල් කෝටි 3·69 කින් සංකෝචනය වූ නමුදු, ඉන් පසුව එක් එක් කාර්තුවේ දී මුදල් සැපැයුම නොපිළිවෙළ කට වුවද, ප්‍රාසාරණය විය. මෙම වර්ෂය තුළ දී අඩු ම මුදල් සැපැයුමක් වාර්තා වූයේ පෙබරවාරි මාසයේ දී ය. එම මාසයේ දී මුදල් සැපැයුම රුපියල් කෝටි 158·19 ක් වූයේ, 1964 දෙසැම්බර් මාසයේ දීට වඩා රුපියල් කෝටි 3·99 ක පහළ වැටීමෙක් පිළිබිඹු විය. වර්ෂයේ මුල් කාර්තුවේ දී මූල්‍ය සංකෝචනයට බොහෝ සෙයින් හේතු වූයේ බැංකු විදේශීය වත්කම් පහල වැටීම හා බැංකු ක්‍රමය වෙතැති රජයේ ණය (ශුද්ධ) අඩුවීම බැව් II (ඇ) 7 වැනි සංඛ්‍යා සටහනින් පෙනී යයි. අනෙක් අතට, වර්ෂයේ දෙවැනි හා තෙවැනි කාර්තු වලදී බැංකු විදේශීය වත්කම් සැහෙන පමණකින් වැඩි වූ අතර, බැංකු ක්‍රමය සමග වූ රජයේ ගනුදෙනු ද වැඩි විය. වර්ෂයේ තෙ වැනි කාර්තුවේ දී පෞද්ගලික අංශයට දෙන ලද දළ බැංකු ණය පරිමාව සැහෙන ප්‍රමාණයකින් සංකෝචනය වූ අතර, කාලීන හා ඉතිරි කිරීම් තැන්පතු වැඩිවීම සංකෝචනාත්මක සාධකයන්ට සැලකිය යුතු ලෙස දායක විය. මුදල් සැපැයුම ජූලි මාසයේ දී රුපියල් කෝටි 169·27 දක්වා මධ්‍ය-වාර්ෂික ඉහළම මට්ටමට නැගීමෙන් හා තෙ වැනි කාර්තුවේ අවසාන මාස දෙකේ දී පහළ වැටීමෙන් ද එය පිළිබිඹු විය. ඔක්තෝබර් මාසයේ දී මුදල් සැපැයුම වැඩි වී නොවැම්බර් මාසයේ දී පහළ වැටින. යළි දෙසැම්බර් මාසයේ දී වැඩි විය. සිව් වැනි කාර්තුව සමස්ථයක් වශයෙන් ගෙන බලන කල, මුදල් සැපැයුමෙහි විශාල වැඩිවීමෙක් දක්නට ලැබුනේ ය. ඊට මූලික වශයෙන්

හේතු වූයේ බැංකු ක්‍රමය වෙතැති රජයේ ණය (ශුද්ධ) වැඩිවීම හා පෞද්ගලික අංශයට දෙන ලද වෙළෙඳ බැංකු ණය වැඩිවීමය. එසේ වුවද, බැංකු විදේශීය වත්කම් කැපී පෙනෙන ලෙස පහළ වැටීමෙන් හා කාලීන හා ඉතිරි කිරීම් තැන්පතු සැහෙන ප්‍රමාණයකින් වැඩිවීමෙන් ප්‍රාසාරණාත්මක සාධකයන්හි බලපෑම සීමා කැරිණි.

### සංඛ්‍යා සටහන II (ඇ) 7

### මුදල් සැපැයුමේ වෙනස - කාර්තු අනුව

රුපියල් දශ ලක්ෂ

| | 1 වැනි කාර්තුව | 2 වැනි කාර්තුව | 3 වැනි කාර්තුව | 4 වැනි කාර්තුව | මුළු වෙනස |
|---|---|---|---|---|---|
| බැංකු විදේශීය වත්කම් (ශුද්ධ) .. | – 37·3 | +57,3 | +96·8 | – 37·1 | +79·7 |
| රජයේ ගනුදෙනු† .. | – 30,6 | +34·0 | + 2·7 | +65·5 | +71·6 |
| පෞද්ගලික අංශයට දෙන ලද ණය†† .. | – 3·1 | + 7·4 | – 33·1 | +31·9 | + 3·2 |
| පෞද්ගලික අංශයේ කාලීන හා ඉතිරි කිරීම් තැන්පතු†† .. | – 10·9 | – 5·6 | – 5·4 | – 26·4 | – 48·3 |
| රජයේ සමායතනවලට දෙන ලද ණය .. | +25·3 | – 26·2 | + 5·0 | + 3·6 | + 7·8 |
| රජයේ සමායතනවල කාලීන හා ඉතිරි කිරීම් තැන්පතු .. | +19·4 | – 8·9 | – 20·1 | +11·1 | + 1·4 |
| මුදල් සැපැයුමේ වෙනස .. | – 36·9 | +64·9 | +24·9 | +41·0 | +93·8 |

සංඛ්‍යා: ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

† භාණ්ඩාගාරය වෙතැති රජයේ මුදල් ශේෂ (ප්‍රමාණය අතින් මේවා සැලකිය යුතු නොවීය) හා බැංකු වෙතැති රජයේ තැන්පතු ඇතුළති.

†† සමුපකාර ආයතන ඇතුළති.

### 1 (ආ) පිරිවැටුම් අනුපාතික

1965 දී බැංකු නොවන පෞද්ගලික අංශයේ මුළු තැන්පතු[1] වැඩිවීම 1964 දී තරම් විශාල නොවීය. 1964 දී ඉහළ ගොස් තිබූ, මෙම තැන්පතු වල පිරිවැටුම් අනුපාතිකයන්හි මාසික සාමාන්‍යය, 1965 දී සුළු වශයෙන් පහළ වැටිණි.

වෙළෙඳ බැංකු වෙතැති, මහජනයා සතු ඉල්ලුම් තැන්පතු රුපියල් කෝටි 3·81 කින් හෙවත් සියයට 5·0 කින් වැඩි විය. 1964 දී එය රුපියල් කෝටි 9·13 කින් හෙවත් සියයට 13·5 කින් වැඩි විය. එහෙත් 1964 දී 1·82 හි තිබූ ඉල්ලුම් තැන්පතු වල පිරිවැටුම් අනුපාතිකය 1965 දී 1·79 දක්වා සියයට 1·6 කින් පහළ වැටුනේ ය. අනෙක් අතට, වෙළෙඳ බැංකු වෙතැති, මහජනයාගේ කාලීන හා ඉතිරි කිරීම් තැන්පතු වැඩිවීම 1964 දීට වඩා විශාල විය. එහෙත් කාලීන තැන්පතු වල මාසික පිරිවැටුම් අනුපාතික සාමාන්‍යය 0·24 දක්වා ඉතා සුළු වශයෙන් වැඩි වූ අතර, ඉතිරි කිරීම් තැන්පතු වල අනුපාතිකය 0·08 දක්වා ඉතා සුළු වශයෙන් පහළ වැටිණි.

ලංකා ඉතිරි කිරීමේ බැංකුව හා තැපැල් කන්තෝරු ඉතිරි කිරීමේ බැංකුව වෙතැති තැන්පතු වල පිරිවැටුම් අනුපාතිකයන්හි වෙනස්වීම සැලකිය යුතු නොවීය.

බැංකු නොවන පෞද්ගලික අංශයේ තැන්පතු සමස්ථයක් වශයෙන් ගත් කල, එහි පිරිවැටුම් අනුපාතික වල පහළ වැටීම සුළු විය. මේ නිසාත්, ද්‍රවශීල වත්කම්හි විවිධ වර්ග කෙරෙහි මහජන වරණයෙහි කිසිදු කැපී පෙනෙන වෙනසෙක් නොදක්නා ලද නිසාත්, මිල පිළිබඳ මහජන බලාපොරොත්තු වර්ෂය තුළ දී සැලකිය යුතු ලෙස වෙනස් නොවුනේ යැයි අනුමාන කිරීම යුක්ති යුක්ත වෙයි.

---

1 තැපැල් කන්තෝරු ඉතිරි කිරීමේ බැංකුව හා ලංකා ඉතිරි කිරීමේ බැංකුව වෙතැති ඉතිරි කිරීම් තැන්පතු හා වෙළෙඳ බැංකු වෙතැති කාලීන හා ඉතිරි කිරීම් තැන්පතු ඇතුළත් වෙයි.

## 1 (ඇ) කාලීන හා ඉතිරි කිරීම් තැන්පතු

මෑත අතීතයේ දී දේශීය ද්‍රවශීලතාව වැඩිවීමේ වැදගත් ලක්ෂණයක් වූයේ වෙළෙඳ බැංකු, තැපැල් කන්තෝරු ඉතිරි කිරීමේ බැංකුව හා ලංකා ඉතිරි කිරීමේ බැංකුව වෙතැති කාලීන හා ඉතිරි කිරීම් තැන්පතු වල ශීඝ්‍ර වර්ධනයයි. 1965 දී මෙම ආයතන වල කාලීන හා ඉතිරි කිරීම් තැන්පතු රුපියල් කෝටි 106·99 දක්වා රුපියල් කෝටි 6·55 කින් හෙවත් සියයට 6·5 කින් වැඩි විය. එහෙත් 1964 රුපියල් කෝටි 8·37 ක් හෙවත් සියයට 9·1 කින් ඇති වූ වැඩි වීමට වඩා මෙය තරමක් අඩුය.

වෙළෙඳ බැංකු වෙතැති කාලීන හා ඉතිරි කිරීම් තැන්පතු රුපියල් කෝටි 4·69 කින් වැඩි විය. මෙය වැඩි වූ මුළු කාලීන හා ඉතිරි කිරීම් තැන්පතු වලින් සියයට 71·6 ක් විය. තැපැල් කන්තෝරු ඉතිරි කිරීමේ බැංකුවේ තැන්පතු රුපියල් කෝටි 1·6 කින් වැඩිවූ අතර, ලංකා ඉතිරි කිරීමේ බැංකුව වෙතැති ශේෂයන් රුපියල් කෝටි 0·26 කින් වැඩි විය. මෙම ආයතන තුනෙහි ම තැන්පතු වල වැඩිවීම් අනුපාතිකය ඉකුත් වර්ෂයේ දීට වඩා අඩු විය.

ඉකුත් අවුරුදු පහේ දී වෙළෙඳ බැංකු වෙත තිබූ කාලීන හා ඉතිරි කිරීම් තැන්පතු II (ඇ) 8 සංඛ්‍යා සටහනින් දක්වෙයි.

### සංඛ්‍යා සටහන II (ඇ) 8

### වෙළෙඳ බැංකු වෙතැති කාලීන හා ඉතිරි කිරීම් තැන්පතු

(පසුගිය පස් අවුරුද්ද තුළ)

රුපියල් දශ ලක්ෂ

| | 1961 | 1962 | 1963 | 1964 | 1965 | වෙනස 61/62 | වෙනස 62/63 | වෙනස 63/64 | වෙනස 64/65 |
|---|---|---|---|---|---|---|---|---|---|
| කාලීන තැන්පතු* .. | 233·1 | 285·5 | 334·0 | 357·6 | 382·8 | +52·4 | +48·5 | +23·6 | +25·2 |
| ඉතිරි කිරීම් තැන්පතු .. | 130·6 | 140·9 | 165·2 | 193·5 | 223·9 | +10·3 | +24·3 | +28·3 | +30·4 |
| එකතුව .. | 363·8 | 426·4 | 499·2 | 551·1 | 606·7 | +62·6 | +72·8 | +51·9 | +55·6 |

සංඛ්‍යා: ශ්‍රී ලංකා මහ බැංකුවෙනි

* මෙහි දක්වෙන කාලීන තැන්පතුවලට රජය සතු කාලීන තැන්පතුද අයත් වේ. 1965 දෙසැම්බර් 31 වැනි දිනට වෙළෙඳ බැංකු වෙතැවූ රජය සතු කාලීන තැන්පතු රුපියල් කෝටි 3·93 ක් විය.

ඉකුත් සිව් වසර තුළ දී වෙළෙඳ බැංකු වෙතැවූ මුළු කාලීන හා ඉතිරි කිරීම් තැන්පතු වැඩිවීම වඩාත් විශාල විය. වෙළෙඳ බැංකු වෙත තිබූ පෞද්ගලික අංශයේ මුළු කාලීන තැන්පතු පරිමාවෙන් සියයට 63 ක් ව්‍යාපාරික අංශය[1] සතුව පැවැති අතර, සියයට 23 ක් පුද්ගලයන් සතුව තිබිණි. වෙළෙඳ බැංකු වෙත තිබූ ඉතිරි කිරීම් තැන්පතු වලින් සියයට අනූ එකක් පුද්ගලයන් සතු විය.

## 1 (ඈ) රජයේ පිළිනපත්

රජයේ මුළු පිළිනපත් සංඛ්‍යාවත්, 1964 හා 1965 රජයේ පිළිනපත් වැඩි වූ ප්‍රමාණයත් හිමිකාර ගණයන් අනුව, II (ඇ) 9 සංඛ්‍යා සටහනින් දක්වෙයි. 1964 මෙන් ම 1965 දී ද, වැඩි වූ රජයේ පිළිනපත් වලින් විශාලතම කොටස සේවක අර්ථසාධක අරමුදල විසින් ගනු ලැබිණි. එහෙත් රජයේ පිළිනපත් වලින් විශාලතම කොටසක අයිතිය තව දුරටත් අර්ධ රාජ්‍ය ඉතිරි කිරීමේ

1 ව්‍යාපාර අංශයට, මූල්‍ය ආයතන, වැවිලි, වෙළෙඳ හා අනෙකුත් ව්‍යාපාරික ගිණුම් ඇතුළත්වන පරිදි අර්ථ නිරූපනය කරන ලදී.

ආයතන වලට හිමි විය. මීලඟට රජයේ පිළිනපත් වලින් දෙවැනි විශාලතම කොටස තිබුනේ වෙළෙඳ බැංකු වෙත වුවද, 1965 දී ඔවුන් වෙතැවූ පිළිනපත් වැඩි වූයේ රුපියල් කෝටි 0·24 කින් පමණෙකි. භාරකාර මණ්ඩල, සුභ සාධක, විශ්‍රාම වැටුප් හා අර්ථසාධක අරමුදල් විසින් රජයේ පිළිනපත් සඳහා කැරුණු ආයෝජන රුපියල් කෝටි 3·25 කින් වැඩි විය. 1965 අවසානයේදී ලංකා රක්‍ෂණ සංස්ථාව වෙතැති රජයේ පිළිනපත් පරිමාව රුපියල් කෝටි 9·70 ක් වූයේ වර්ෂය තුළ රුපියල් කෝටි 4·20 ක වැඩිවීමෙක් පිළිබිඹු විය. පෞද්ගලික රක්‍ෂණ සමාගම් විසින් රජයේ සුරැකුම්වල රුපියල් කෝටි 13·39 ක් ආයෝජනය කර තිබූ නමුදු වර්ෂය තුළ දී එය වැඩි වූයේ රුපියල් කෝටි 0·47 කින් පමණි. 1965 දී මුළු රජයේ පිළිනපත් පරිමාවෙන් සියයට 20·4 ක් රජයේ නිදන් අරමුදල් හා රජයේ අනෙකුත් අරමුදල් වෙත තිබූ අතර, වර්ෂය තුළ එහි වැඩිවීම සියයට 26·1 ක් විය. 1965 දී මුළු රජයේ පිළිනපත් වලින් සියයට 42·9 ක් සේවක අර්ථසාධක අරමුදල, රක්‍ෂණ සංස්ථාව හා අර්ධ රාජ්‍ය ඉතිරි කිරීමේ ආයතන වෙත තිබූ අතර, වර්ෂයේ දී වැඩි වූ පිළිනපත් වලින් සියයට 58 ක් මෙම ආයතන සතු විය. රජයේ පිළිනපත් සඳහා වූ වෙළෙඳ පොළෙහි මෙම ආයතන වලට හිමි වී ඇති අද්විතීය ප්‍රමුඛත්වය විවිධ කල්පිරීම් වලින් යුත් රජයේ පිළිනපත් සඳහා වූ පොලී අනුපාතික මට්ටම හා ආකෘතිය යන දෙක ම කෙරෙහි දැඩි බලපෑමක් ඇති කරයි. 1965 දී පුද්ගලයන් වෙතැති රජයේ පිළිනපත් රුපියල් කෝටි 0·39 කින් හෙවත් සියයට 21·2 කින් වැඩි විය. පුද්ගලයන් වෙතැති මුළු රජයේ පිළිනපත් පරිමාව, නොබේරූ මුළු පිළිනපත් වලින් සියයට එකක් පමණ වන බැවින් එහි වැඩිවීම වෙළෙඳ පොළ කෙරෙහි වැදගත් බලපෑමක් ඇති නොකළේ ය. එතකුදු වුවත්, එය පෞද්ගලික ආයෝජකයාගේ විශ්වාසය පුනරුත්ථානය වීම පිළිබඳ ඉඟියකි.

## සංඛ්‍යා සටහන II (ඈ) 9
## රජයේ පිළිනපත් අයිතිය

රුපියල් දශ ලක්ෂ

| | 1963 | 1964 | 1965 | වෙනස 1963/64 | වෙනස 1964/65 |
|---|---|---|---|---|---|
| බැංකු ක්‍රමය * .. | 311·1 | 322·5 | 324·9 | + 11·4 | + 2·4 |
| රජයේ දෙපාර්තමේන්තුවල හා අනෙකුත් කාර්යාලයීය අරමුදල් .. | 99·9 | 115·4 | 120·9 | + 15·5 | + 5·5 |
| ජාතික නිවාස හා රාජ්‍ය ණය නිදන් අරමුදල් .. | 227·4 | 269·0 | 331·3 | + 41·6 | + 62·3 |
| සේවක අර්ථසාධක අරමුදල .. | 239·3 | 303·5 | 373·4 | + 64·2 | + 69·9 |
| භාරකාර මණ්ඩල, සුභසාධක, විශ්‍රාම වැටුප් හා අර්ථසාධක අරමුදල් .. | 239·7 | 256·5 | 289·0 | + 16·8 | + 32·5 |
| රක්ෂණ සංස්ථාව .. | 19·9 | 55·0 | 97·0 | + 35·1 | + 42·0 |
| රක්ෂණ සමාගම් .. | 124·3 | 129·2 | 133·9 | + 4·9 | + 4·7 |
| අර්ධ රාජ්‍ය ඉතිරි කිරීම් ආයතන .. | 414·1 | 443·6 | 482·4 | + 29·5 | + 38·8 |
| පුද්ගලයන් .. | 17·9 | 18·4 | 22·3 | + 0·5 | + 3·9 |
| අනෙකුත් .. | 44·8 | 46·5 | 44·6 | + 1·7 | − 1·9 |
| එකතුව .. | 1,738·5 | 1,959·6 | 2,219·6 | +221·1 | +260·0 |

සබංධා; ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

* මෙම ශීර්ෂය 1963 දී රුපියල් දශ ලක්ෂ 11·5 ක් හා 1964/65 දී රුපියල් දශ ලක්ෂ 8·0 ක් වූ මහ බැංකුව වෙතැති රජයේ පිළිනපත් ඇතුළති.

## 1 (ඉ) පොළී අනුපාතික

මහ බැංකුව විසින්, වෙළෙඳ බැංකු වලට ණය දීමේ පොළී අනුපාතිකය (මහ බැංකු පොළී අනුපාතිකය) 1965 මැයි 28 වැනි දින සිට බල පැවැත්වෙන පරිදි සියයට 4 සිට සියයට 5 දක්වා වැඩි කරන ලදී. ඊට අනුකූලව, සියළු ම වෙළෙඳ බැංකු වල ණය දීමේ පොළී අනුපාතිකය ද ජූනි මාසයේ දී ඉහළ ගියේ ය. බද්ධ ව්‍යාපාර වස්තු සමාගම් කොටස්, වෙළෙඳ තොග හා නිශ්චල දේපල ඇපයට තබාගෙන දෙනු ලබන ණය සඳහා අය කැරෙන අවම පොළී අනුපාතිකය සියයට 7 දක්වා වැඩි කරන ලදී. ඇප රහිත ණය සඳහා අය කැරෙන අවම පොළී අනුපාතිකය සියයට 7 දක්වා සියයට 2 කින් වැඩි කරනු ලැබිණ. රජයේ සුරැකුම්පත් සඳහා වූ සියයට $5\frac{1}{2}$ අවම පොළී අනුපාතිකය හා අනෙකුත් ණයවල අවශිෂ්ඨ ගණය සඳහා වූ සියයට 5 පොළී අනුපාතිකය හැරෙන්නට අනෙකුත් සියළුම වර්ග වල බැංකු ණය සඳහා සියයට 7 ක අවම පොළී අනුපාතිකයක් ක්‍රියාත්මක වූයේ ය. බද්ධ ව්‍යාපාර වස්තු සමාගම් කොටස්, වෙළෙඳ තොග ඇප වශයෙන් තබාගෙන දෙනු ලබන ණය හා අනෙකුත් ණය ගණය සඳහා අය කැරෙන උපරිම පොළී අනුපාතිකය සියයට 9 දක්වා වැඩි කරනු ලැබිණ. අපනයනකරුවන් විසින් දක්වන ලද කරුණු අනුව, අපනයන තොග ඇප වශයෙන් තබාගෙන දෙනු ලබන අත්තිකාරම් සඳහා වූ පොළී අනුපාතිකය අඩු කරවා ගැනීමට වෙළෙඳ බැංකු කැමතිකරවා ගැනීම් වස් මහ බැංකුව විසින් එය සතු අවනත කරවා ගැනීමේ ශක්තිය යොදනු ලැබිණි.

මහ බැංකු පොළී අනුපාතිකය ඉහළ යාමෙන් බලපෑමක් නොලබා එසේ ම පැවතුනේ වාණිජ බිල් සඳහා වූ වට්ටම් අනුපාතිකය පමණෙකි.

මහ බැංකුවෙන් ණය ගැන්මේ වියදම වැඩිවීම හේතු කොට ගෙන වෙළෙඳ බැංකු විසින් ඒවායේ ඒක්‍ෂණ මුදල් අනුපාතිකය සියයට 0·25 සිට සියයට 3 දක්වා වැඩි කරනු ලැබිණි.

නොවැම්බර් මාසයේ දී මහජන බැංකුව විසින් එහි ඉතිරි කිරීම් තැන්පතු වල පොළී අනුපාතිකය සියයට 3 දක්වා ද, රුපියල් 25,000 දක්වා වූ ස්ථාවර තැන්පතු වල පොළී අනුපාතිකය සියයට $3\frac{1}{4}$ දක්වා ද වැඩි කරන ලදී. රු. 25,000 ට වැඩි මුදල් ප්‍රමාණ සඳහා පොළිය ද වැඩි කැරිණි.

65 5–31 වැනි දින රජයේ උකස් බැංකුව විසින්, සංවර්ධන ණය සඳහා වූ උපරිම පොළී අනුපාතිකය සියයට 7·0 දක්වා ද, සංවර්ධනය සඳහා නොවන ණය සඳහා වූ උපරිම පොළී අනුපාතිකය සියයට 8·0 දක්වා ද වැඩි කරනු ලැබිණි. 65 8–1 වැනි දින කාෂිකාර්මික හා කාර්මික ණය දෙන ආයතනය ද, අවම පොළී අනුපාතිකය සියයට 6·5 දක්වා වැඩි කිරීමෙන් එහි ණය දීමේ පොළී අනුපාතිකය ගලපා ගත්තේය.

තැපැල් කන්තෝරු ඉතිරි කිරීමේ බැංකුවේ හා ලංකා ඉතිරි කිරීමේ බැංකුවේ තැන්පතු වල පොළී අනුපාතික, වර්ෂය තුළ දී නොවෙනස්ව පැවතුණි.

භාණ්ඩාගාර බිල් වෙනුවෙන් වූ ටෙන්ඩර අනුපාතිකය 1962 සිට ස්ථාවරව සියයට 2·80 හි පැවතිණ. 1965 ජූලි මාසයේ පටන් භාණ්ඩාගාර බිල් අනුපාතිකය වැඩිවීගෙන යාමක් පැහැදිලිව දක්නට ලැබුන අතර, වර්ෂයේ අවසාන තෙමසේ දී මාසික නිකුතු සඳහා බර තබන ලද අනුපාතික සාමාන්‍යය සියයට 3 ක් විය. භාණ්ඩාගාර බිල් මිල දී ගැනීම වෙනුවෙන් මහ බැංකුවට ගෙවන ලද අනුපාතිකය 1965 අගෝස්තු සිට බල පැවැත්වෙන පරිදි සියයට 0·76 සිට සියයට 1·0 දක්වා වැඩිකරනු ලැබිණි.

අවුරුදු 20 ට වැඩි කල්පිරීම් වලින් යුත් රජයේ ණය වෙනුවෙන් වූ පොළී අනුපාතිකය නොවෙනස්ව සියයට 4½ පැවති අතර, එය 1965 මැයි 28 වැනි දින පටන්, සියයට 5 ක් වූ මහ බැංකු පොළී අනුපාතිකයටත් පහළින් පැවතුනේය. මීට ඉහත දී සම්ප්‍රදායයක් වශයෙන් ඉහත කී අන්දමේ රජයේ ණය වෙනුවෙන් වූ පොළී අනුපාතිකය මහ බැංකු පොළී අනුපාතිකයට ඉහළින් පැවතිණි. එසේ වුවද, එහි ප්‍රතිඵලයක් වශයෙන් රජයේ පිළිනපත් සඳහා ආයෝජනයට ඉදිරපත් වන අරමුදල් පරිමාව නුදුරු අනාගතයේ දී පහළ වැටේ යැයි සිතිය නොහැකිය.

**2. වෙළෙඳ බැංකු කටයුතු**

1965 අවසානය වන විට පෞද්ගලික අංශයට දෙන ලද බැංකු ණය (දළ) රුපියල් කෝටි 0·42 කින් වැඩිවිය. මෙය ඉකුත් සිව් වසර තුළ වාර්තා වී ඇති අඩුම සංඛ්‍යාව වෙයි. ඉල්ලුම් තැන්පතු කෙරෙහි වූ ද්‍රවශීල වත්කම් අනුපාතය සියයට 55 සිට සියයට 62·8 දක්වා සැලකිය යුතු අන්දමින් වැඩිවිය. ලාංකික බැංකු දෙක හේතු කොට ගෙන ණය ප්‍රසාරණය සිදු වූ අතර විදේශීය බැංකු කටයුතු හේතුකොට ගෙන ණයෙහි පොදු සංකෝචනයක් ඇතිවිය. 1965 දී මුළු බැංකු තැන්පතු වලින් සියයට 66 ක් ලාංකික බැංකු සතුව තිබිණි.

**2. (අ) බැංකු ශාඛාවන්**

1962-1965 කාලච්ඡේදය තුළ බැංකු කාර්යාල විහිදී ගිය අයුරු හා ලාංකික, බ්‍රිතාන්‍ය, ඉන්දියානු හා පකිස්ථානු බැංකු අතර මුළු තැන්පතු පරිමාව බෙදී ගිය අයුරු පහත එන II (ඇ)-10 සංඛ්‍යා සටහනෙහි දැක්වෙයි.

**සංඛ්‍යා සටහන II (ඇ) 10**

**බැංකු කාර්යාල සහ තැන්පතු බෙදී ගිය අන්දම 1962-1965**

| | එකතුව | | | ලාංකික බැංකු | | | බ්‍රිතාන්‍ය බැංකු | | | ඉන්දියානු සහ පකිස්ථානු බැංකු | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | කාර්යාල ගණන | තැන්පතු | | කාර්යාල ගණන | තැන්පතු | | කාර්යාල ගණන | තැන්පතු | | කාර්යාල ගණන | තැන්පතු | |
| | | ප්‍රමාණය රුපියල් මිලියන | % | | ප්‍රමාණය රුපියල් මිලියන | % | | ප්‍රමාණය රුපියල් මිලියන | % | | ප්‍රමාණය රුපියල් මිලියන | % |
| 1962 | 73 | 1,182 | 100 | 57 | 683 | 58 | 12 | 429 | 36 | 4 | 70 | 6 |
| 1963 | 83 | 1,301 | 100 | 67 | 801 | 61 | 12 | 412 | 32 | 4 | 88 | 7 |
| 1964 | 88 | 1,447 | 100 | 72 | 943 | 65 | 12 | 415 | 29 | 4 | 90 | 6 |
| 1965 | 97 | 1,546 | 100 | 81 | 1,023 | 66 | 12 | 431 | 28 | 4 | 92 | 6 |

සංඛ්‍යා: ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

සාමාලෝචනයට භාජන වූ වර්ෂයේ අවසානය වනවිට බැංකු කාර්යාල 97 ක් ලංකාවේ ක්‍රියාත්මක වෙමින් තිබිණි. මෙයින් 16 ක් බ්‍රිතාන්‍ය, ඉන්දියානු හා පකිස්ථානු බැංකු කාර්යාල වූ අතර ඉතිරි 81 ලාංකික බැංකු දෙකෙහි ශාඛාවන් විය. බැංකු කාර්යාල 97 න් 69 ක් කොළඹින් පිට පිහිටා තිබිණි. මහජන බැංකුවේ මුළු කාර්යාල සංඛ්‍යාව 48 ක් වූ අතර එයින් 8 ක්ම සාමාලෝචනයට භාජනවූ වර්ෂය තුළදී විවෘත කරන ලද කාර්යාල විය. අලුත් බැංකු ශාඛා, හොරණ, කැකිරාව, පදවිය, මන්නාරම, ඇඹිලිපිටිය, යටියන්තොට, කිලිනොච්චිය හා කොළඹ මහ ලේකම් කාර්යාලයෙහි පිහිටුවනු ලැබිණ. ලංකා බැංකුව අලුත් කාර්යාලයක් කොළඹ නගරය තුළ විවෘත කැරිණි.

මහජන බැංකුව විසින්, නියාමක පරිමාවකට ක්‍රියාත්මක කැරුන ග්‍රාමීය බැංකු ව්‍යාපාරය මගින්, වී ගොවිතැනෙහි හා අපනයන නොවන වගාවන්හි නියුතු ගැමි ගොවියාට බැංකු පහසුකම් ලබාදීම සඳහා ප්‍රයත්නයක් දරන ලදී. 1964 දී,

සමුපකාර දෙපාර්තමේන්තුවත් සමග එක්ව, ග්‍රාමීය බැංකු[1] වශයෙන් කටයුතු කිරීම සඳහා සමුපකාර සංගම් අටක්[2] තෝරා ගන්නා ලදී. එහෙත් එම වර්ෂයේදී ග්‍රාමීය බැංකු ලෙස නියම වශයෙන් පිහිටුවනු ලැබුවේ සංගම් තුනක් පමණි. 1965 ජූලි වන විට සංගම් අටම ග්‍රාමීය බැංකු ලෙස කටයුතු කරන්නට විය.

### 2 (ආ) මූල්‍ය සම්පත්-ලද අයුරු හා යෙදවූ අයුරු

වෙළෙඳ බැංකුවල මූල්‍ය සම්පත් වෙනස් වූ අයුරු හා එම සම්පත් යෙදවූ අයුරු II (ඇ)-11 සංඛ්‍යා සටහනෙහි දැක්වෙයි.

**සංඛ්‍යා සටහන II (ඇ) 11**

**1962/65 බැංකු සම්පත් වාර්ෂිකව වෙනස් වූ අයුරු සහ ඒවා යෙද වූ අයුරු**

රුපියල් දශ ලක්ෂ

| | 1962 | 1963 | 1964 | 1965 |
|---|---|---|---|---|
| **මුදල් ලැබුණු මාර්ග** | | | | |
| **1. රාජ්‍ය අංශය** | **84·8** | **14·8** | **2·9** | **11·8** |
| ණය ගැනීම් වැඩිවීම | 5·0 | — | — | — |
| බැංකු වෙතැති රජයේ ණයපත් අඩුවීම | — | 5·5 | — | — |
| තැන්පතු වැඩිවීම | 79·8 | 9·3 | 2·9 | 11·8 |
| **2. මහ බැංකුවෙන් ණය ගැනීම වැඩිවීම** | — | **37·9** | — | — |
| **3. දේශීය පෞද්ගලික අංශය** | **125·0** | **115·3** | **154·9** | **148·8** |
| තැන්පතු වැඩිවීම | 82·4 | 109·9 | 143·8 | 85·0 |
| සංචිත හා ගෙවන ලද ප්‍රාග්ධන ආදිය වැඩිවීම | 7·5 | 5·4 | 4·4 | 9·1 |
| අනෙකුත් වගකීම් වැඩිවීම | — | — | — | 54·7 |
| අනෙකුත් වත්කම් අඩුවීම | 35·1 | — | 6·7 | — |
| **4. විදේශීය අංශය** | **5·6** | **8·2** | — | **11·5** |
| ණය ගැනීම් වැඩිවීම | — | — | — | 1·2 |
| තැන්පතු වැඩිවීම | — | — | — | 1·3 |
| විදේශීය ශේෂ අඩුවීම | 5·6 | 8·2 | — | 9·0 |
| **5. දේශීය මුදල් ශීර්ෂ අඩුවීම** | — | **1·1** | — | — |
| සම්පත්වල මුළු වැඩිවීම | **215·4** | **177·3** | **157·8** | **172·1** |
| **මුදල් යෙදවූ අයුරු** | | | | |
| **1. රාජ්‍ය අංශය** | **71·4** | **25·8** | **8·7** | **92·3** |
| ණය ගැනීම් අඩුවීම | — | — | 5·0 | — |
| බැංකු වෙතැති රජයේ ණයපත් වැඩිවීම | 71·4 | — | 0·4 | 32·8 |
| තැන්පතු අස්කර ගැනීම | — | 25·8 | 3·3 | 59·5 |
| රජයට දෙනු ලැබූ කෙටි කාලීන ණය වැඩිවීම | | | | |
| **2. මහ බැංකුවෙන් ණයගැනීම් අඩුවීම** | **20·6** | — | **18·8** | **12·8** |
| **3. දේශීය පෞද්ගලික අංශය** | **88·1** | **150·4** | **63·9** | **47·9** |
| අත්තිකාරම් වැඩිවීම | 41·2 | 136·9 | 62·8 | 4·2 |
| අනෙකුත් වගකීම් අඩුවීම | 46·9 | 1·5 | 1·1 | — |
| අනෙකුත් වත්කම් වැඩිවීම | — | 12·0 | — | 43·7 |
| **4. විදේශීය අංශය** | **4·2** | **1·3** | **22·1** | — |
| ණය ගැනීම් අඩුවීම | 3·5 | 0·6 | 0·8 | — |
| තැන්පතු අස්කර ගැනීම | 0·7 | 0·7 | 0·1 | — |
| විදේශීය ශේෂ වැඩිවීම | — | — | 21·2 | — |
| **5. ස්වදේශීය මුදල් ශීර්ෂ වැඩිවීම** | **30·6** | — | **43·7** | **18·7** |
| යෙදවූ සම්පත්වල මුළු වැඩිවීම | **214·9** | **177·5** | **157·2** | **171·7** |

සංඛ්‍යා: ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

1. ග්‍රාමීය බැංකු වලට මහජනයාගෙන් මෙන්ම සාමාජිකයන්ගෙන්ද ඉතිරිකිරීම් තැන්පතු බාර ගැනීමේ බලය පැවරී තිබිණි. සාමාජිකයින්ට ණය දීමේදී සමිතියට ලබාගත හැකි සම්පත් වැඩිකර ගැනීමට මහජන බැංකුවෙන් ණය පහසුකම් ලබාගැනීමට ද ග්‍රාමීය බැංකුවලට ඉඩකඩ සැළසිණි. ණය අය කර ගැනීම මහජන බැංකුව විසින් පරිපාලනය කරන ලදී.
2. අටෙන් හතක් විවිධ සේවා සමුපකාර වූ අතර, එකක් ණය දෙන සමිතියක් විය.

1965 දී වෙළෙඳ බැංකුවල මුළු සම්පත් පරිමාව රුපියල් කෝටි 17·21 කින් වැඩිවිය. මෙම වැඩිවීම සඳහා බොහෝ දුරට හේතුවූයේ පෞද්ගලික අංශයේ තැන්පතු රුපියල් කෝටි 8·5 කින් වැඩිවීම හා ණයවර ලිපි වෙනුවෙන් තබාගනු ලබන ආන්තිකයන් ඇතුළත් ඔවුන්ගේ අනෙකුත් වගකීම් වැඩිවීම ය. බැංකු වල ගෙවන ලද ප්‍රාග්ධනය, නොබෙදූ ලාභ, හා සංචිත රුපියල් කෝටි 0·91 කින් වැඩි විය. වෙළෙඳ බැංකු වෙතැති රජයේ තැන්පතු රුපියල් කෝටි 1·18 කින් වැඩි විය. 1964 දී එය වැඩිවූයේ රුපියල් කෝටි 0·29 කිනි.

බැංකුවල වැඩිවූ සම්පත් වලින් කොටසක් රජයේ වෙළෙඳ කටයුතු වලට මුදල් යෙදවීම පිණිස උපයෝගී කර ගන්නා ලදී. වෙළෙඳ බැංකු විසින් රජයේ ණයපත් සඳහා කරන ලද ආයෝජනයන් රුපියල් කෝටි 3·28 කින් වැඩිවූ අතර, රජයට දෙන ලද කෙටි කාලීන ණය රුපියල් කෝටි 5·95 කින් වැඩිවිය.

වැඩි වූ සම්පත් වලින් පෞද්ගලික අංශයට බැංකු අත්තිකාරම් වශයෙන් ඇදී ගියේ රුපියල් කෝටි 0·42 ක් පමණි. අනෙකුත් වත්කම් ලෙස වර්ග කර තිබුන වෙළෙඳ බැංකුවල විවිධ වත්කම් රුපියල් කෝටි 4·37 කින් වැඩිවිය. මහ බැංකුවට වූ ණය ගැතිකම රුපියල් කෝටි 1·28 කින් අඩු කරන ලද අතර, වෙළෙඳ බැංකුවල මුදල් වත්කම් වැඩි කිරීම සඳහා රුපියල් කෝටි 1·87 ක අතිරේක මුදලක් යොදවනු ලැබිණි.

**2 (ඇ) බැංකු වගකීම් සැකසුම**

1954–1965 කාලච්ඡේදය තුළ වෙළෙඳ බැංකුවල වත්කම් හා වගකීම් බෙදී ගිය අයුරු පිළිබඳ සම්පිණ්ඩනයක් II (ඇ)-12 වැනි සංඛ්‍යා සටහනෙහි දැක්වෙයි.

1964 දී රුපියල් කෝටි 13·0 කින් හෙවත් සියයට 8·5 කින් වැඩි වූ වෙළෙඳ බැංකුවල මුළු වත්කම්/වගකීම් පරිමාව, 1965 දී රුපියල් කෝටි 165·84 සිට රුපියල් කෝටි 181·44 දක්වා රුපියල් කෝටි 15·60 කින් හෙවත් සියයට 9·4 කින් වැඩිවිය. වෙළෙඳ බැංකුවල මුළු වගකීම්හි සම්පූර්ණ වැඩිවීම කෙරෙහි බෙහෙවින්ම හේතුවූයේ මුළු තැන්පතු රුපියල් කෝටි 9·83 කින් ද, අනෙකුත් වගකීම් රුපියල් කෝටි 5·47 කින් ද වැඩිවීම හා අන්තර් බැංකු ණය ගැනීම් රුපියල් කෝටි 0·73 කින් අඩුවීමය. 1965 දී වෙළෙඳ බැංකුවල මුළු තැන්පතු වගකීම් වැඩිවීම සියයට 6·8 ක් වූයේ, 1964 දී ඇතිවූ සියයට 11·2 ක වැඩිවීමට වඩා සැලකිය යුතු අන්දමින් අඩුවිය. 1964 දී ඉල්ලුම් තැන්පතුවල වැඩිවීම කාලීන හා ඉතිරි කිරීම් තැන්පතුවල වැඩිවීමට වඩා විශාල විය සමාලෝචනයට භාජන වූ වර්ෂයේ දී ඊට ප්‍රති විරුද්ධ සම්බන්ධතාවයක් දක්නට ලැබීමෙන් පොළී ලැබෙන තැන්පතු කෙරෙහි වූ සැලකිය යුතු මහජන කැමැත්තක් පිළිබිඹු විය.

වැඩිවූ තැන්පතු වලින් විශාල කොටසක් පෞද්ගලික අංශයේ තැන්පත් කරුවන් සතු විය. රජයේ සමායතන හා සමුපකාර ආයතන ඇතුළු පෞද්ගලික අංශයේ තැන්පත් කරුවන්ගේ ඉල්ලුම් තැන්පතු රුපියල් කෝටි 3·81 කින් වැඩිවිය. රජයේ සමායතන හා සමුපකාර ආයතන ඇතුළු පෞද්ගලික අංශයේ තැන්පත් කරුවන්ගේ කාලීන හා ඉතිරි කිරීම් තැන්පතු රුපියල් කෝටි 4·69 කින් වැඩි විය. වෙළෙඳ බැංකු වෙතැති, රජයේ ඉල්ලුම් තැන්පතු රුපියල් කෝටි 0·31 කින් ද, කාලීන තැන්පතු රුපියල් කෝටි 0·87 කින් ද වැඩි විය.

මහ බැංකුව විසින් නිතිපතා පවත්වනු ලබන අර්ධ වාර්ෂික සමීක්ෂණ මත පිහිටා සැකසුන, වෙළෙඳ බැංකු වෙතැති පෞද්ගලික අංශයේ තැන්පතු වල ප්‍රධාන හිමිකම් ගණයන් පිළිබඳ සංක්ෂිප්ත විග්‍රහයක් II (ඇ)-13 සංඛ්‍යා සටහනින් දැක්වෙයි.

## සංඛ්‍යා සටහන II (ඇ) 12

## වෙළෙඳ බැංකුවල වත්කම් හා වගකීම් බෙදී ගිය අයුරු

(මාසික සංඛ්‍යා සාමාන්‍යය)

රුපියල් දශ ලක්ෂ

| | 1954 | 1955 | 1956 | 1957 | 1958 | 1959 | 1960 | 1961 | 1962 | 1963 | 1964 | 1965 | කාලච්ඡේදය අවසානයේදී දෙසැ: 1964 | කාලච්ඡේදය අවසානයේදී දෙසැ: 1965 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| අතැති මුදල් හා මහ බැංකුවේ ඇති තැන්පතු (ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතා ඇතුළුව) .. | 106 | 149 | 148 | 139 | 119 | 116 | 132 | 148 | 186 | 164 | 182 | 224 | 214 | 233 |
| විදේශීය ශේෂ .. .. .. .. .. | 55 | 112 | 116 | 72 | 50 | 52 | 58 | 54 | 55 | 44 | 49 | 55 | 54 | 45 |
| භාණ්ඩාගාර බිල් .. .. .. .. .. | 60 | 51 | 39 | 34 | 16 | 24 | 28 | 51 | 89 | 128 | 73 | 89 | 94 | 127 |
| වට්ටම් කළ බිල් .. .. .. .. .. | 73 | 94 | 93 | 100 | 116 | 119 | 115 | 122 | 136 | 114 | 126 | 173 | 131 | 185 |
| මුළු ද්‍රවශීල වත්කම් .. .. .. .. | 294 | 406 | 396 | 345 | 301 | 311 | 333 | 375 | 466 | 450 | 430 | 541 | 493 | 590 |
| මුළු ආයෝජන (1) .. .. .. .. | 221 | 245 | 291 | 308 | 296 | 285 | 284 | 290 | 303 | 313 | 330 | 329 | 329 | 329 |
| මුළු ලෝන හා අයිරාවන් .. .. .. | 208 | 244 | 273 | 340 | 363 | 395 | 430 | 435 | 477 | 495 | 633 | 669 | 652 | 665 |
| ඉල්ලුම් තැන්පතු (2) .. .. .. .. | 562 | 675 | 731 | 721 | 661 | 655 | 657 | 677 | 829 | 789 | 853 | 917 | 896 | 939 |
| කාලීන හා ඉතිරිකිරීම් තැන්පතු .. .. .. | 126 | 190 | 206 | 240 | 263 | 300 | 340 | 359 | 380 | 460 | 535 | 572 | 551 | 607 |
| මුළු තැන්පතු .. .. .. .. .. | 689 | 869 | 941 | 965 | 926 | 955 | 998 | 1036 | 1209 | 1250 | 1389 | 1490 | 1447 | 1546 |
| අනුපාතය .. .. .. .. .. | % | % | % | % | % | % | % | % | % | % | % | % | % | % |
| ඉල්ලුම් තැන්පතුවලට වූ මුදල් .. .. .. | 18·9 | 22·1 | 20·2 | 19·3 | 18·0 | 17·7 | 20·1 | 21·9 | 22·4 | 20·8 | 21·3 | 24·4 | 23·9 | 24·8 |
| මුළු තැන්පතුවලට වූ මුදල් .. .. .. | 15·4 | 17·1 | 15·7 | 14·4 | 12·9 | 12,1 | 13·2 | 14·3 | 15·4 | 13·1 | 13·1 | 15·0 | 14·8 | 15·1 |
| මුළු තැන්පතුවලට වූ විදේශීය ශේෂ .. .. | 8·0 | 12·9 | 12·3 | 7·4 | 5·4 | 5·4 | 5·8 | 5·2 | 4·5 | 3·5 | 3·5 | 3·7 | 3·7 | 2·9 |
| මුළු තැන්පතුවලට වූ භාණ්ඩාගාර බිල් .. .. | 8·7 | 5·9 | 4·1 | 3·5 | 1·7 | 2·5 | 2·8 | 4·9 | 7·4 | 10·2 | 5·3 | 6·0 | 6·5 | 8·2 |
| මුළු තැන්පතුවලව වූ වට්ටම් කළ වාණිජ බිල් .. | 10·6 | 10·8 | 9·9 | 10·3 | 12·5 | 12·5 | 11·5 | 11·8 | 11·2 | 9·1 | 9·1 | 11·6 | 9·0 | 12·0 |
| ඉල්ලුම් තැන්පතුවලට වූ ද්‍රවශීල වත්කම් .. | 52·3 | 60·1 | 54·2 | 47·9 | 45·5 | 47·5 | 50·7 | 55·4 | 56·2 | 57·0 | 50·4 | 59·0 | 55·0 | 62·8 |
| මුළු තැන්පතුවලට වූ ද්‍රවශීල වත්කම් .. .. | 42·7 | 46·7 | 42·1 | 35·8 | 32·5 | 32·6 | 33·4 | 36·2 | 38·5 | 36·0 | 31·0 | 36·3 | 34·1 | 38·2 |
| මුළු තැන්පතුවලට වූ ආයෝජන .. .. | 32·1 | 28·2 | 30·9 | 31·7 | 32·0 | 29·8 | 28·5 | 28·0 | 25·1 | 25·0 | 23·8 | 22·1 | 22·7 | 21·3 |
| මුළු තැන්පතුවලට වූ ලෝන හා අයිරාවන් .. | 30·2 | 28·1 | 29·0 | 35·2 | 39·2 | 41·4 | 43·1 | 42·0 | 39·4 | 39·6 | 45·6 | 44·9 | 45·1 | 43·0 |

සංඛ්‍යා—ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

(1) රජය හා රජය ඇප වූ සුරැකුම්පත් සහ මහ බැංකු නිකුතු

(2) දේශීය අන්තර් බැංකු තැන්පතු ඇතුළත් නැත.

## සංඛ්‍යා සටහන II (ඇ) 13

### තැන්පතු හිමිකම්
### (කාලච්ඡේදය අවසානයේ දී)

රුපියල් දශ ලක්ෂ

| හිමියා | ඉල්ලුම් | | කාලීන | | ඉතිරි කිරීම් | | එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රමාණය | % | ප්‍රමාණය | % | ප්‍රමාණය | % | ප්‍රමාණය | % |
| **මූල්‍ය ආයතන:** | | | | | | | | |
| දෙසැම්බර්, 1964 .. | 41·1 | 5·7 | 71·6 | 22·0 | 8·2 | 4·2 | 120·9 | 9·7 |
| ජූනි, 1965 .. | 42·0 | 5·9 | 60·4 | 19·9 | 7·2 | 3·5 | 109·6 | 9·0 |
| දෙසැම්බර්, 1965 .. | 45·4 | 5·9 | 69·0 | 21·3 | 7·7 | 3·4 | 122·1 | 9·3 |
| **වැවිලි:** | | | | | | | | |
| දෙසැම්බර්, 1964 .. | 68·4 | 9·4 | 31·3 | 9·6 | 0·4 | 0·2 | 100·1 | 8·0 |
| ජූනි, 1965 .. | 62·4 | 8·8 | 26·3 | 8·7 | 0·3 | 0·1 | 89·1 | 7·3 |
| දෙසැම්බර්, 1965 .. | 78·2 | 10·2 | 34·6 | 10·7 | 0·3 | 0·1 | 113·0 | 8·6 |
| **වෙළෙඳ:** | | | | | | | | |
| දෙසැම්බර්, 1964 .. | 166·1 | 22·8 | 37·6 | 11·6 | 3·9 | 2·0 | 207·5 | 16·7 |
| ජූනි 1965 .. | 161·4 | 22·8 | 60·2 | 19·8 | 3·0 | 1·4 | 224·7 | 18·4 |
| දෙසැම්බර්, 1965 .. | 158·8 | 20·7 | 54·2 | 16·7 | 3·2 | 1·4 | 216·2 | 16·5 |
| **අනෙක් ව්‍යාපාර:** | | | | | | | | |
| දෙසැම්බර්, 1964 .. | 76·5 | 10·5 | 54·6 | 16·8 | 1·5 | 0·8 | 132·7 | 10·7 |
| ජූනි, 1965 .. | 101·3 | 14·3 | 39·4 | 13·0 | 2·2 | 1·1 | 143·0 | 11·7 |
| දෙසැම්බර්, 1965 .. | 104·5 | 13·7 | 46·5 | 14·3 | 2·4 | 1·1 | 153·4 | 11·7 |
| **ප්‍රාදේශීය බලමණ්ඩල:** | | | | | | | | |
| දෙසැම්බර්, 1964 .. | 26·8 | 3·7 | 27·2 | 8·4 | 0·2 | 0·1 | 54·2 | 4·3 |
| ජූනි, 1965 .. | 22·1 | 3·1 | 25·5 | 8·4 | 0·2 | 0·1 | 47·8 | 3·9 |
| දෙසැම්බර්, 1965 .. | 17·5 | 2·3 | 25·0 | 7·7 | 0·2 | 0·1 | 42·7 | 3·2 |
| **ව්‍යාපාරික නොවන ආයතන:** | | | | | | | | |
| දෙසැම්බර්, 1964 .. | 74·8 | 10·3 | 22·5 | 6·9 | 3·4 | 1·8 | 100·7 | 8·1 |
| ජූනි. 1965 .. | 39·3 | 5·6 | 19·7 | 6·5 | 3·6 | 1·7 | 62·6 | 5·1 |
| දෙසැම්බර්, 1965 .. | 52·3 | 6·8 | 19·6 | 6·0 | 4·5 | 2·0 | 76·4 | 5·8 |
| **පුද්ගලයන්:** | | | | | | | | |
| දෙසැම්බර්, 1964 .. | 273·3 | 37·6 | 80·4 | 24·7 | 176·0 | 90·9 | 529·7 | 42·5 |
| ජූනි, 1965 .. | 278·2 | 39·3 | 72·2 | 23·8 | 191·7 | 92·0 | 542·1 | 44·5 |
| දෙසැම්බර්, 1965 .. | 308·7 | 40·3 | 75·6 | 23·3 | 205·9 | 91·8 | 590·3 | 44·9 |
| **එකතුව:** | | | | | | | | |
| දෙසැම්බර්, 1964 .. | 727·0 | 100·0 | 325·1 | 100·0 | 193·6 | 100·0 | 1245·8 | 100·0 |
| ජූනි, 1965 .. | 706·9 | 100·0 | 303·7 | 100·0 | 208·3 | 100·0 | 1218·9 | 100·0 |
| දෙසැම්බර්, 1965 .. | 765·3 | 100·0 | 324·5 | 100·0 | 224·3 | 100·0 | 1314·1 | 100·0 |

සංඛ්‍යා: ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

1965 දී, ප්‍රාදේශීය බල මණ්ඩල හා ව්‍යාපාරික නොවන ආයතන හැර අනෙකුත් සෑම හිමිකාර ගණයක් ම සතු බැංකු තැන්පතු වැඩිවිය. වර්ෂයේ අවසානය වන විට පෞද්ගලික අංශයේ මුළු බැංකු තැන්පතු වලින් සියයට 46 ක් ව්‍යාපාරික අංශය ලෙස වර්ග කළ හැකි මූල්‍ය ආයතන, වැවිලි, වෙළෙඳ හා අනෙකුත් ව්‍යාපාර ගණයන් සතුව තිබිණි. මුළු තැන්පතු පරිමාවෙන් සියයට 50·7 ක් ව්‍යාපාරික නොවන ආයතන හා පුද්ගලයන් සතුව පැවති අතර ප්‍රාදේශීය බලමණ්ඩල සතුව තිබුනේ මුළු තැන්පතු පරිමාවෙන් සියයට 3·2 ක් පමණි.

විශාලම තැන්පතු පරිමාව පුද්ගලයන් සතුව පැවතිණි. ඔවුන් ගේ ඉල්ලුම් තැන්පතු රුපියල් කෝටි 3·54 කින්ද, ඉතිරි කිරීම් තැන්පතු රුපියල් කෝටි 2·99 කින් ද වැඩිවිය. එහෙත් පුද්ගලයන් සතු කාලීන තැන්පතු රුපියල් කෝටි 0·48 කින් සංකෝචනය විය. පසුගිය අවුරුදු කීපය තුළදී පහල වැටීමේ ප්‍රවණතාවයක් දැක්වූ වැවිලි ගණයෙහි තැන්පතු 1965 දී වැඩි විය. වැවිලි ගණයෙහි ඉල්ලුම් හා කාලීන තැන්පතු පිළිවෙළින් රුපියල් කෝටි 0·98 කින් හා රුපියල් කෝටි 0·33 කින් වැඩි වූ නමුදු ඒවායේ ඉතිරි කිරීම් තැන්පතු

රුපියල් කෝටි 0·01 කින් සුළු වශයෙන් පහළ වැටිණි. වෙළෙඳ ගිණුම් වල වූ ඉල්ලුම් හා ඉතිරි කිරීම් තැන්පතු සංකෝචනය වීමේ ප්‍රවණතාවය දැක්වූයේ වී නමුදු මෙම ගණයේ කාලීන තැන්පතු රුපියල් කෝටි 1·66 කින් සැලකිය යුතු ලෙස වැඩිවිය. අනෙකුත් ව්‍යාපාරික ගිණුම් යටතේ වර්ග කැරුන ඉල්ලුම් තැන්පතු රුපියල් කෝටි 2·8 කින් වැඩිවූ නමුදු කාලීන තැන්පතු රුපියල් කෝටි 0·81 කින් පහළ වැටිණි.

## 2 (ඇ) බැංකු වත්කම් සැකසුම

වෙළෙඳ බැංකු වල වත්කම් හා වගකීම් ව්‍යාප්තිය, සහ ප්‍රධාන වත්කම් වර්ග සංක්ෂිප්ත ලෙස දක්වමින් එය මුළු තැන්පතු වල සහ/හෝ ඉල්ලුම් තැන්පතු වල ප්‍රතිශතයක් වශයෙන් ද ඉහළ, II (ඇ) 12 වැනි සංඛ්‍යා සටහනෙහි පෙන්වා ඇත.

1965 දී වෙළෙඳ බැංකු ඉහළ මට්ටමක ද්‍රවශීලතාවයක් පවත්වාගෙන යනු ලැබිණි. 1964 දෙසැම්බර්/1965 දෙසැම්බර් කාලච්ඡෙදය තුළ දී බැංකු වල මුළු ද්‍රවශීල වත්කම් රුපියල් කෝටි 49·3 සිට රුපියල් කෝටි 59·0 දක්වා රුපියල් කෝටි 9·7 කින් වැඩි විය. අතැති මුදල් හා මහ බැංකුව වෙතැති තැන්පතු රුපියල් කෝටි 1·9 කින් වැඩි වූ අතර, ඉල්ලුම් තැන්පතු කෙරෙහි වූ මුදල් අනුපාතය සියයට 24·8 ක් විය. වෙළෙඳ බැංකු වල විදේශීය ශේෂ රුපියල් කෝටි 0·90 කින් පහළ වැටිණි. මිලට ගන්නා ලද හා වට්ටම් කරන ලද වාණිජ බිල් රුපියල් කෝටි 5·4 කින් වැඩි වූ අතර, එය මුළු තැන්පතු වගකීම් වලින් සියයට 12·0 ක් විය. වෙළෙඳ බැංකු වෙතැති භාණ්ඩාගාර බිල්, එහි මුළු තැන්පතු වලින් සියයට 8·2 ක් වූ අතර, වර්ෂය තුළ එහි රුපියල් කෝටි 3·30 ක වැඩි වීමක් පිළිබිඹු විය. ඉල්ලුම් තැන්පතු කෙරෙහි වූ මුළු ද්‍රවශීල වත්කම් අනුපාතය සියයට 62·8 ක් වූයේ, එය ඉකුත් දශකය තුළ වාර්තා වූ ඉහළම සංඛ්‍යාව විය. මුළු තැන්පතු කෙරෙහි වූ ද්‍රවශීල වත්කම් අනුපාතය සියයට 38·2 ක් විය. මෙම අනුපාත දෙකෙන් දැක්වෙන අධික ද්‍රවශීලතා මට්ටම 1965 බැංකු ක්‍රමය සතු අඩුවෙන් උපයෝගී කරගනු ලැබූ සම්පත් පිළිබඳ ඉඟියක් පමණි.

රජයේ පිළිනපත් සඳහා කැරුන වෙළෙඳ බැංකු ආයෝජන සංචරව රුපියල් කෝටි 32·9 හි පැවතිනි. 1964 දී රුපියල් කෝටි 10·68 කින් වැඩි වූ වෙළෙඳ බැංකු ලෝන හා අයිරාවන් 1965 දී වැඩි වුනේ රුපියල් කෝටි 1·3 කින් පමණෙකි. මුළු බැංකු වත්කම් කෙරෙහි වූ ලෝන හා අයිරා අනුපාතය 1964 දෙසැම්බර් අවසානයේ දී සියයට 45·1 සිට 1965 දෙසැම්බර් අවසානයේ දී සියයට 43·0 දක්වා පහළ වැටිණි.

## 2. (ඉ) පෞද්ගලික අංශයට දෙන ලද වෙළෙඳ බැංකු ණය

මාර්තු මාසයේ දී හැර, වර්ෂයේ මුල් පස් මාසයේ දී පෞද්ගලික අංශයට දෙන ලද වෙළෙඳ බැංකු ණය වැඩි විය. ජූනි මාසයෙන් ඇරඹුන සත් මාසය තුළදී ජූලි, ඔක්තෝබර්, නොවැම්බර් හා දෙසැම්බර් යන මාස වලදී පෞද්ගලික අංශයට දෙනලද වෙළෙඳ බැංකු ණය වැඩි විය. මුළු අවුරුද්ද තුළදී පෞද්ගලික අංශයට දෙන ලද දළ බැංකු ණය රුපියල් කෝටි 0·42 කින් වැඩි විය.

පෞද්ගලික අංශයට දෙන ලද බැංකු ණය, අත්තිකාරම් වර්ග අනුව විග්‍රහ කොට II (ඇ)-14 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත.

### සංඛ්‍යා සටහන II (ඇ) 14

## පෞද්ගලික අංශයට දෙන ලද වෙළෙඳ බැංකු අත්තිකාරම්
## 1964 දෙසැම්බර් - 1965 දෙසැම්බර්

රුපියල් දශ ලක්ෂ

| | ලාංකික බැංකු | | | විදේශීය බැංකු | | | සියලු බැංකු | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | 1964 දෙසැ: | 1965 දෙසැ: | වෙනස | 1964 දෙසැ: | 1965 දෙසැ: | වෙනස | 1964 දෙසැ: | 1965 දෙසැ: | වෙනස |
| අ. එකතු කෙරීගෙන යන මුදල් ශීර්ෂයන් * .. .. | 73·3 | 69·7 | — 3·6 | 1·2 | 1·4 | + 0·2 | 74·5 | 71·1 | — 3·4 |
| ආ. මෙරට බිල්පත් .. .. | — | — | — | — | ... | ... | — | ... | ... |
| ඇ. ආනයන බිල්පත් .. .. | 20·7 | 27·0 | + 6·3 | 27·9 | 22·7 | — 5·2 | 48·6 | 49·7 | + 1·1 |
| ඈ. අපනයන බිල්පත් .. | 13·8 | 11·6 | — 2·2 | 39·8 | 35·5 | — 4·3 | 53·6 | 47·1 | — 6·5 |
| ඉ. අයිරාවන් .. .. | 170·5 | 174·2 | + 3·7 | 201·8 | 208·8 | + 7·0 | 372·3 | 383·0 | +10·7 |
| ඊ. ණය .. .. | 226·8 | 243·4 | +16·6 | 52·6 | 38·3 | —14·3 | 279·4 | 281·7 | + 2·3 |
| එකතුව .. | 505·2 | 525·8 | + 20·6 | 323·3 | 306·8 | —16·5 | 828·5 | 832·7 | + 4·2 |

සංඛ්‍යා: ශ්‍රී ලංකා මහ බැංකුවෙනි

* අය ලබා ගැනීම සඳහා යැවුනු චෙක්පත් වැනි අන්තර් බැංකු ණය, මෙ ගණයෙහි අඩංගු වී ඇත්තේ ඉතා සුළු වශයෙනි. බැංකු විසින්, සහතික මිල ක්‍රමය යටතේ, ආහාර ද්‍රව්‍යයන් මිලදී ගැනීම සඳහා සමුපකාර ආයතනයන්ට දෙනු ලැබූ ඉතා කෙටි කාලීන අත්තිකාරම්ය මෙහි බෙහෙවින්ම ඇත්තේ.

1965 දී එකතු කෙරීගන යන මුදල් ශීර්ෂ පහළ වැටුනේ යල් කන්නේ අස්වැන්න තරමක් පාලුවීම නිසා සහතික මිල ක්‍රමය යටතේ කෘෂිකාර්මික ආහාර ද්‍රව්‍ය මිළදී ගැනීම සඳහා දෙන ලද, නොපියවා තිබූ අත්තිකාරම් පහල වැටීම හේතු කොට ගෙනය. මෙයට තවත් හේතුවක් වූයේ ගොවිජන සේවා කොමසාරිස් වෙත කරුණු දැක්වීමෙන් පසුව ඔහු විසින් වෙළෙඳ බැංකු වලට මුදල් ආපසු ගෙවීම ඉක්මන් කිරීමය. 1965 දී ආනයන බිල් රුපියල් කෝටි 0·11 කින් සුළු වශයෙන් වැඩිවූ නමුදු ආනයන බිල්වල මාසික වටිනාකම් සාමාන්‍යය රුපියල් කෝටි 4·52 ක් වූයේ, 1964 මාසික වටිනාකම් සාමාන්‍යයවූ රුපියල් කෝටි 5·92 ට වඩා අඩු විය. 1964 සමග සසඳන කල, 1965 දී ආනයන වටිනාකම කැපී පෙනෙන ලෙස පහළ වැටුන බැව් එයින් නිසැකවම පිළිබිඹු වෙයි. 1964 සමග සසඳන කල, 1965 දී අපනයන වටිනාකම තරමක් වැඩි වූ නමුදු අපනයන බිල් රුපියල් කෝටි 0·65 කින් පහළ වැටුනේය. 1964 වර්ෂයේදී ද අපනයන වටිනාකම 1963 මට්ටමෙට වඩා කැපී පෙනෙන ලෙස වැඩි වී තිබුන නමුදු අපනයන බිල් රුපියල් කෝටි 1·92 කින් පහල වැටී තිබිණි. 1964 දී රුපියල් කෝටි 10·68 කින් වැඩි වූ ලෝන හා අයිරාවන් 1965 දී වැඩි වූයේ රුපියල් කෝටි 1·3 කින් පමණෙකි. 1965 වැඩි වූ ලෝන හා අයිරාවන් අතුරෙන් රජයේ සමායතනවලට දෙන ලද ලෝන හා අයිරාවන් රුපියල් කෝටි 0·78 කින් ද, සමූපකාර ආයතනවලට දෙන ලද ලෝන හා අයිරාවන් රුපියල් කෝටි 0·56 කින් ද වැඩි විය.

බැංකු අත්තිකාරම් පිළිබඳ සංඛ්‍යා, අරමුණු හා කල් පිරීම් ව්‍යාප්තිය අනුව වර්ග කර II (ඇ) – 15 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත. මේ සංඛ්‍යා තොරතුරු ප්‍රයෝජනයට ගැනීමේදී, විශේෂයෙන් විමසිලිමත් විය යුතුය. එසේ වියයුත්තේ කර්මාන්ත, වාණිජ කටයුතු හා කෘෂිකාර්මික කටයුතුවල නියුතු ව්‍යාපාරික

ආයතන වැනි එක් ව්‍යාපාරයකට වැඩි ගණනක නියුතු ව්‍යාපාරික ආයතනවලට දෙන ලද අත්තිකාරම් අරමුණු අනුව වර්ග කිරීම දුෂ්කරවන බැවිනි. හැරත්, ණය ගැනුම් කරුවා විසින් එක්තරා අරමුණක් සඳහා යයි කියන ලද අත්තිකාරම් ඊට හාත්පසින්ම වෙනස් වූ අරමුණක් සඳහා යෙදවීමට පිළිවන. විශේෂයෙන්ම, ණය සිමාකිරීම් පනවා ඇති විටෙක එය සිදුවිය හැකිය.

### සංඛ්‍යා සටහන II (ඇ) 15

### *අත්තිකාරම් අරමුණු හා කල්පිරීම අනුව

### (කාලච්ඡේදය අවසානයේ දී)

රුපියල් දශ ලක්ෂ

| අරමුණ | | කෙටි කාලීන (6 මාසයට අඩු) | | මැදි කාලීන (6 මාසයේ සිට මාස 30 දක්වා) | | දිගු කාලීන (මාස 30ට වැඩි) | | එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | (1) | (2) 7 හි % වශයෙන් (1) | (3) | (4) 7 හි % වශයෙන් (3) | (5) | (6) 7 හි % වශයෙන් (5) | (7) | (8) එකතු වෙහි % වශයෙන් (7) |
| අ. වානිජ | දෙසැම්බර් 1964 .. | 216·2 | 47·1 | 173·8 | 37·9 | 69·1 | 15·1 | 459·1 | 61·0 |
| | ජූනි 1965 .. | 180·5 | 41·0 | 187·2 | 42·5 | 72·8 | 16·5 | 440·5 | 57·9 |
| | දෙසැම්බර් 1965 .. | 183·4 | 41·2 | 182·1 | 40·9 | 80·0 | 18·0 | 445·4 | 58·4 |
| ආ. මූල්‍ය | දෙසැම්බර් 1964 .. | 26·5 | 29·1 | 30·0 | 32·9 | 34·6 | 38·0 | 91·1 | 12·1 |
| | ජූනි 1965 .. | 37·4 | 40·9 | 23·9 | 26·1 | 30·3 | 33·1 | 91·5 | 12·0 |
| | දෙසැම්බර් 1965 .. | 29·6 | 32·6 | 26·5 | 29·2 | 34·6 | 38·1 | 90·8 | 11·9 |
| ඇ. කෘෂිකාර්මික | දෙසැම්බර් 1964 .. | 6·3 | 21·9 | 7·9 | 27·4 | 14·7 | 51·0 | 28·8 | 3·8 |
| | ජූනි 1965 .. | 6 0 | 20·1 | 9·0 | 30·1 | 14·9 | 49·8 | 29·9 | 3·9 |
| | දෙසැම්බර් 1965 .. | 8·6 | 24·8 | 13·6 | 39·2 | 12·4 | 35·7 | 34·7 | 4·5 |
| ඈ. කාර්මික | දෙසැම්බර් 1964 .. | 24·8 | 34·4 | 20·1 | 27·9 | 27·2 | 37·7 | 72·1 | 9·6 |
| | ජූනි 1965 .. | 28·9 | 33·0 | 26·0 | 29·7 | 32·6 | 37·3 | 87 5 | 11·5 |
| | දෙසැම්බර් 1965 .. | 29·6 | 40·1 | 21·3 | 28·9 | 22·9 | 31·0 | 73·8 | 9·7 |
| ඉ. පාරිභෝජන | දෙසැම්බර් 1964 .. | 12·0 | 24·5 | 15·0 | 30·7 | 21·9 | 44·8 | 48·9 | 6·5 |
| | ජූනි 1965 .. | 7·2 | 13·3 | 19·3 | 35·5 | 27·7 | 51·0 | 54·3 | 7·1 |
| | දෙසැම්බර් 1965 .. | 10·9 | 16·8 | 19·9 | 30·8 | 33·9 | 52·4 | 64·7 | 8·5 |
| ඊ. අනෙකුත් ණය | දෙසැම්බර් 1964 .. | 25·0 | 47·6 | 9·2 | 17·5 | 18·4 | 35·0 | 52·5 | 7·0 |
| | ජූනි 1965 .. | 26·9 | 47·4 | 12·4 | 21·8 | 17·5 | 30·8 | 56·8 | 7·5 |
| | දෙසැම්බර් 1965 .. | 25·1 | 46·9 | 9·9 | 18·5 | 18·4 | 34·4 | 53·5 | 7·0 |
| උ. එකතුව | දෙසැම්බර් 1964 .. | 310·8 | 41·3 | 255·9 | 34·0 | 185·9 | 24·7 | 752·5 | 100·0 |
| | ජූනි 1965 .. | 286·9 | 37·7 | 277·8 | 36·5 | 195·8 | 25·7 | 760·5 | 100·0 |
| | දෙසැම්බර් 1965 .. | 287·2 | 37·6 | 273·5 | 35·8 | 202·2 | 26·5 | 762·9 | 100·0 |

සංඛ්‍යා: ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

* ලෝන, අයිරාවන් හා වට්ටම් කරන ලද බිල්පත් අත්තිකාරම් වලට ඇතුළත්වේ. එකතු වෙමින් පවත්නා මුදල් ශීර්ෂ එයට ඇතුළත් නොවේ.

වාණිජ අරමුණු සඳහා දෙන ලද මුළු බැංකු අත්තිකාරම් රුපියල් කෝටි 1·37 කින් පහළ වැටීමට මුළුමනින්ම හේතුවූයේ අපනයන ණය රුපියල් කෝටි 1·05 කින්ද, ආනයන ණය රුපියල් කෝටි 2·0 කින්ද අඩුවීම හා තොග හා සිල්ලර වෙළෙඳාම සඳහා දෙන ලද ණය රුපියල් කෝටි 0·87 කින්ද, අනෙකුත් වාණිජ ණයවල ඉතිරි ගණයෙන් රුපියල් කෝටි 0·81 කින්ද වැඩිවීමය. කාර්මික අරමුණු සඳහා දෙන ලද ණය රුපියල් කෝටි 0·17 කින් වැඩිවිය. තේ, රබර් හා පොල් වගාව, සතුන් ඇති කිරීම හා කිරිපට්ටි සඳහා දෙන ලද ණය ඇතුලත් වන පරිදි විග්‍රහ කොට ඇති, වෙළෙඳ බැංකුවල කෘෂිකාර්මික

ණය රුපියල් කෝටි 0·59 කින් වැඩිවිය. තේ වගාව සඳහා දෙන ලද ණය රුපියල් කෝටි 0·23 කින්ද, රබර් වගාව සඳහා දෙන ලද ණය රුපියල් කෝටි 0·16 කින්ද වැඩිවිය. පාරිභෝගික ණය රුපියල් කෝටි 1·58 කින් වැඩිවූ අතර අනෙකුත් ණය රුපියල් කෝටි 0·10 කින් වැඩිවිය.

සංඛ්‍යා සටහන II (ඇ) 16

අත්තිකාරම්* ඇප වර්ග අනුව

| | 1964 දෙසැම්බර් 31 | | 1965 ජුනි 30 | | 1965 දෙසැම්බර් 31 | |
|---|---|---|---|---|---|---|
| | ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ | එකතුවේ % වශයෙන් | ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ | එකතුවේ % වශයෙන් | ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ | එකතුවේ % වශයෙන් |
| ලේඛන ගත බිල් .. .. | 125·8 | 16·7 | 121·8 | 16·0 | 126·6 | 16·6 |
| රජයේ සුරැකුම් පත්.. .. | 9·6 | 1·3 | 7·1 | 0·9 | 4·6 | 0·6 |
| බද්ධ ව්‍යාපාර වස්තු සමාගම් කොටස් .. .. | 20·3 | 2·7 | 21·0 | 2·8 | 18·0 | 2·4 |
| කාලීන හා ඉතිරි කිරීම් තැන්පතු හා අනෙකුත් මුදල් තැන්පතු (ජීවිත රක්ෂණ ඔප්පුවල වටිනාකම ඇතුළුව). | 34·0 | 4·5 | 39·8 | 5·2 | 50·9 | 6·7 |
| වෙළෙඳ තොග .. .. | 210·2 | 27·9 | 203·9 | 26·8 | 202·4 | 26·5 |
| නිශ්චල දේපොල .. .. | 73·9 | 9·8 | 80·4 | 10·6 | 66·4 | 8·7 |
| අනෙකුත් .. .. | 202·1 | 26·9 | 202·0 | 26·6 | 208·8 | 27·4 |
| ඇප රහිත .. .. | 76·6 | 10·2 | 84·4 | 11·1 | 85·1 | 11·1 |
| එකතුව .. .. | 752·5 | 100·0 | 760·5 | 100·0 | 762·9 | 100·0 |

සංඛ්‍යා: ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

* එකතු කෙරීගෙන යන මුදල් ශීර්ෂයන් අයත් නොවේ.

වෙළෙඳ බැංකු අත්තිකාරම්, ඇප වර්ග අනුව විග්‍රහ කොට II (ඇ) 16 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත. 1965 දී ලේඛන ගත බිල්, රජයේ සුරැකුම් පත්, බද්ධ ව්‍යාපාර වස්තු සමාගම් කොටස්, හා නිශ්චල දේපල ඇප වශයෙන් තබාගන දෙන ලද අත්තිකාරම් පහළ වැටිණි. ලේඛන ගත බිල් ඇප වශයෙන් තබාගන දෙන ලද ලෝන තරමක් වැඩි වූ අතර රජයේ සුරැකුම් පත් ඇප වශයෙන් තබාගනු දෙන ලද ලෝන රුපියල් කෝටි 0·50 කින් පහළ වැටුනේය. වෙළෙඳ තොග ඇප වශයෙන් තබා ගෙන දෙන් ලද ලෝන රුපියල් කෝටි 0·78 කින් පහළ වැටිණි. කාලීන හා ඉතිරි කිරීම් තැන් පතු සහ ජීවිත ඔප්පු ඇප වශයෙන් තබාගෙන දෙන ලද අත්තිකාරම් සැලකියයුතු ලෙස රුපියල් කෝටි 1·69 කින් වැඩිවිය. 1964 දී එය රුපියල් කෝටි 0·31 කින් සුළු වශයෙන් වැඩිවිය. අනෙකුත් වර්ගවල ඇප යටතේ දෙන ලද ණය රුපියල් කෝටි 0·67 කින් වැඩිවූ අතර, ඇප රහිත ණය රුපියල් කෝටි 0·85 කින් වැඩිවිය.

බැංකු අත්තිකාරම්, පොළී අනුපාතිකයන් අනුව විග්‍රහ කොට II (ඇ) 17 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත. 1965 මැයි මාසයේදී මහ බැංකු පොළී අනු පාතිකය සියයට 4 සිට සියයට 5 දක්වා වැඩි කරනු ලැබිය. වෙළෙඳ බැංකුද ණය දීමේ පොළී අනුපාතිකය ඊට අනුකූලව වැඩි කරන ලදී. මහ බැංකු පොළී අනුපාතිකය වැඩි කිරීමෙහි ප්‍රතිඵලයක් වශයෙන්, සියයට 4½ සිට 6 අතරේ පොළී අනුපාතිකයනට දෙන ලද අත්තිකාරම් වර්ෂයේ දෙවැනි භාගය තුළදී

සැලකිය යුතු ලෙස පහළ වැටිණි. 1964 දෙසැම්බර් මාසයේදී මුළු බැංකු අත්තිකාරම් වලින් සියයට 5·4 ක් සියයට 4½ පොළියට දී තිබූ නමුදු 1965 දෙසැම්බර් වන විට එය මුළු අත්තිකාරම් වලින් සියයට 1·2 දක්වා පහළ වැටිණි. 1964 දෙසැම්බර් මාසයේදී රුපියල් කෝටි 29·92 ක් හෙවත් මුළු අත්තිකාරම් වලින් සියයට 42·6 ක් වූ සියයට 6 ක පොළී දරන අත්තිකාරම් ගණය 1965 දෙසැම්බර් මාසයේදී රුපියල් කෝටි 6·22 ක් හෙවත් සියයට 8·6 දක්වා පහළ වැටුනේය. සියයට 6½ හා ඊට වැඩි පොළී අනුපාතිකයන් දරන අත්තිකාරම් ජූනි අවසානයේදී රුපියල් කෝටි 53·78 හෙවත් සියයට 75·8 ශි තිබී 1965 දෙසැම්බර් අවසානයේදී රුපියල් කෝටි 58·44 හෙවත් සියයට 81·2 දක්වා වැඩිවිය. එහෙත් ඉතාම වැදගත් වැඩිවීමෙක් සටහන්වී ඇත්තේ සියයට 6½ පොළියක් දරන අත්තිකාරම් සම්බන්ධයෙනි.

සංඛ්‍යා සටහන II (ඇ) 17

**වෙළෙඳ බැංකු අත්තිකාරම්* - පොළී අනුපාතිකයන් අනුව**

| පොළී අනුපාතිකය | 1964 දෙසැම්බර් 31 | | 1965 ජූනි 30 | | 1965 දෙසැම්බර් 31 | |
|---|---|---|---|---|---|---|
| | ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ | එකතුවේ % වශයෙන් | ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ | එකතුවේ % වශයෙන් | ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ | එකතුවේ % වශයෙන් |
| 2½ ට අඩු .. .. | 4·0 | 0·6 | 4·3 | 0·6 | 4·4 | 0·6 |
| 2½ .. .. | — | — | 1·0 | 0·1 | 0·1 | ... |
| 3 .. .. | 0·9 | 0·1 | 0·2 | ... | 0·2 | ... |
| 3½ .. .. | 2·2 | 0·3 | 1·3 | 0·2 | 1·4 | 0·2 |
| 4 .. .. | 3·7 | 0·5 | 5·6 | 0·8 | 3·7 | 0·5 |
| 4½ .. .. | 38·2 | 5·4 | 31·2 | 4·4 | 8·8 | 1·2 |
| 5 .. .. | 25·5 | 3·6 | 43·0 | 6·1 | 22·3 | 3·1 |
| 5½ .. .. | 14·2 | 2·0 | 4·8 | 0·7 | 31·6 | 4·4 |
| 6 .. .. | 299·2 | 42·6 | 80·6 | 11·4 | 62·2 | 8·6 |
| 6½ .. .. | 23·5 | 3·3 | 9·2 | 1·3 | 130·8 | 18·2 |
| 7 .. .. | 209·2 | 29·8 | 349·6 | 49·2 | 235·3 | 32·7 |
| 7½ .. .. | 7·2 | 1·0 | 34·2 | 4·8 | 52·3 | 7·3 |
| 8 සහ ඉන් වැඩි .. | 75·0 | 10·7 | 144·8 | 20·4 | 166·0 | 23·1 |
| එකතුව .. | 702·8 | 100·0 | 709·8 | 100·0 | 719·2 | 100·0 |

සංඛ්‍යා: ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

* පවත්නා විනිමය අනුපාතිකයන් අනුව මිලට ගත් අපනයන බිල්පත් හා එකතු කෙරීගෙන යන මුදල් ශීර්ෂයන්ද අයත් නොවේ.

1965 දී පෞද්ගලික අංශයට දෙන ලද වෙළෙඳ බැංකු ණය සැලකිය යුතු ලෙස වැඩි නොවූ නමුදු, අත්තිකාරම් වර්ග, අරමුණු, ඇප වර්ග හා පොළී අනුපාතික අනුව වර්ග කරන ලද ණය වර්ග තුළ සැලකිය යුතු වෙනස්වීම් දක්නට ලැබුණි. මිලට ගත් ආනයන බිල් සුළු වශයෙන් වැඩි වූ නමුදු ආනයන කටයුතු සඳහා දෙන ලද බැංකු ණය රුපියල් කෝටි 2·0 කින් පහළ වැටුනේය. අනෙක් අතට, වෙළෙඳ තොග ඇපයට තබාගෙන දෙන ලද අත්තිකාරම් වැඩිවිය. මුළු අපනයන වැඩිවූ නමුදු මිලට ගත් අපනයන බිල් මෙන්ම අපනයන කටයුතු සඳහා දෙන ලද ලෝන හා අයිරාවන් ද පහළ වැටිණි. මෙවැනි සම්බන්ධතාවයක් 1964 දී ද දක්නට ලැබුණි.

**3. ඉතිරි කිරීම් හා දිගු කාලීන ණයදෙන ආයතන.**

රජයේ අනුග්‍රහය ලබන ඉතිරි කිරීම් හා දිගු කාලීන ණය දෙන ආයතනවල ණය ගනු දෙනු II (ඇ) 18 සංඛ්‍යා සටහනෙහි දැක්වෙයි.

## සංඛ්‍යා සටහන II (ඈ) 18

### දිගු කාලීන ණය දෙන ආයතනයන්ගේ ණය ගනුදෙනු

රුපියල් දහස් ගණනින්

| | 1962 | | 1963 | | 1964 | | 1965 | |
|---|---|---|---|---|---|---|---|---|
| | දෙන ලද ණය | නො-බේරූ ප්‍රමාණය | දෙන ලද ණය | නො-බේරූ ප්‍රමාණය | දෙන ලද ණය | නො-බේරූ ප්‍රමාණය | දෙන ලද ණය | නො-බේරූ ප්‍රමාණය |
| සංවර්ධන මුදල් සමායතනය * .. | 3,555 | 22,841 | 1,864 | 23,072 | 7,231 | 27,802 | 4,010 | 28,316 |
| ලංකා ඉතිරි කිරීම් බැංකුව .. | 2,801 | 11,635 | 3,428 | 13,387 | 3,935 | 15,528 | 2,846 | 16,345 |
| කෘෂිකාර්මික හා කාර්මික ණය ආයතනය .. .. | 2,477 | 29,874 | 3,338 | 29,231 | 5,774 | 31,018 | 4,942 | 32,424 |
| රජයේ උකස් බැංකුව .. .. | 2,553 | 55,785 | 3,135 | 55,119 | 3,532 | 54,662 | 3,942 | 54,681 |
| ණය මණ්ඩලය .. .. | 1,660 | 12,309 | 1,033 | 12,204 | 1,107 | 12 113 | 540 | 11,411 |
| ජාතික නිවාස දෙපාර්තමේන්තුව**† | 9,799 | n.a. | 9,208 | n.a. | 3,914 | n.a. | 8,972 | n.a. |
| එකතුව .. .. | 22,845 | 132,444 | 22,006 | 133,013 | 25,493 | 141,123 | 25,252 | 143,177 |

සංඛ්‍යා: ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

* සාමාන්‍ය කොටස් ආයෝජනය ද ඇතුළති.
** මුදල් වර්ෂය ඔක්තෝබර් / සැප්තැම්බර්.
† දෙපාර්තමේන්තු නිවාස ක්‍රමයන් ද ඇතුළත් වේ.

1965 දී ඉතිරි කිරීම් හා දිගු කාලීන ණය දෙන ආයතන වලින් දෙන ලද ණය සුළු වශයෙන් සංකෝචනය වූ අතර, මෙම වර්ෂය තුළදී දෙන ලද මුළු ණය පරිමාව රුපියල් 2,52,52,000 ක් විය. සංවර්ධන යෝජනා ක්‍රමවල සාමාන්‍ය කොටස් සඳහා කැරුන රු. 2,00,000 ක ආයෝජනයක් ද ඇතුළුව සංවර්ධන සමායතනය විසින් 1965 දී දෙන ලද මුළු ණය පරිමාව රුපියල් 40,10,000 ක් විය. රජයේ උකස් බැංකුව හා ජාතික නිවාස දෙපාර්තමේන්තුව හැර, II (ඈ) 18 සංඛ්‍යා සටහනෙහි දැක්වෙන හැම ආයතනයක්ම මෙම වර්ෂය තුළදී ඔවුන්ගේ ණය ගනුදෙනු අඩු කළහ. සංවර්ධන මුදල් සමායතනය, කෘෂිකාර්මික හා කාර්මික ණය දෙන ආයතනය, හා රජයේ උකස් බැංකුව යන මෙකී ණය දෙන ආයතන කිසිවෙකින් මෙම වර්ෂය තුළදී නව ප්‍රාග්ධනයක් ලබා නොගැනිණි.

## සංඛ්‍යා සටහන II (ඈ) 19

### ඉතිරි කිරීම් තැන්පතු හා ඉතිරි කිරීම් සහතික

රුපියල් දශ ලක්ෂ

| | 1964 දෙසැම්බර් | 1965 දෙසැම්බර් | වෙනස 64 දෙසැ: / 65 දෙසැ: |
|---|---|---|---|
| තැපැල් කන්තෝරු ඉතිරි කිරීම් බැංකුව .. | 402·3 | 418·3* | + 16·0* |
| ලංකා ඉතිරි කිරීම් බැංකුව .. | 81·6 | 84·2* | + 2·6* |
| වෙළෙඳ බැංකු (කාලීන හා ඉතිරි කිරීම් තැන්පතු) ** .. .. | 551·1 | 606·7 | + 55·6 |
| නොපියවූ ඉතිරි කිරීම් සහතික .. | 37·4 | 41·8 | + 4·4 |
| එකතුව .. .. | 1,072·4 | 1,151·0* | + 78·6* |

සංඛ්‍යා: ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

* තාවකාලිකයි.
** රජය සතු තැන්පතු ඇතුළත්ය.

තැපැල් කන්තෝරු ඉතිරි කිරීමේ බැංකුව හා ලංකා ඉතිරි කිරීමේ බැංකුව වෙතැවූ මුළු ඉතිරිකිරීමේ සහතික පත්‍ර හා ඉතිරි කිරීම් තැන්පතු පරිමාව හා වෙළෙඳ බැංකු වෙතැ වූ කාලීන හා ඉතිරි කිරීම් තැන්පතු පරිමාව 1965 දී රුපියල් කෝටි 7.86 කින් හෙවත් සියයට 7.3 කින් ඉහළ ගියේය. 1964 දී එහි වැඩිවීම සියයට 8.7 ක් වූයේය. වෙළෙඳ බැංකු වෙතැ වූ කාලීන හා ඉතිරි කිරීම් තැන්පතු රුපියල් කෝටි 5.56 කින් ඉහළ ගියේය. තැපැල් කන්තෝරු ඉතිරිකිරීමේ බැංකුව හා ලංකා ඉතිරි කිරීමේ බැංකුව වෙතැ වූ තැන්පතු පිළිවෙලින් රුපියල් කෝටි 1.60 කින් හා රුපියල් කෝටි 0.26 කින් වැඩිවිය. මෙම වර්ෂය තුළ දී සේවක අර්ථ සාධක අරමුදලට එකතු වූ මුළු මුදල රුපියල් කෝටි 6.39 ක් වූයේ ඉකුත් වර්ෂයේදීට වඩා රුපියල් කෝටි 0.3 ක වැඩවීමෙක් පිළිබිඹු විය.